ARCHIVAL & RESEARCH UNIT

# UNDERGRADUATE RESEARCH SYMPOSIUM 2021

## RESEARCH ABSTRACTS

# UNDERGRADUATE RESEARCH SYMPOSIUM 2021

URS'21
JULY

# RESEARCH ABSTRACTS

2021

C.DE S.KULATHILAKE
ARCHIVAL & RESEARCH UNIT
Faculty of Music
University of the Visual & Performing Arts

*2021 July*
Research abstracts is published annually by the C. de S. Kulathilake Archival and Research Unit of the Faculty of Music of the University of the Visual & Performing Arts, Sri Lanka. The objective of the publication is to disseminate knowledge of research conducted by undergraduate researches in the disciplines of Music, Dance, Visual Arts and Social Science.

*Editorial Policy:* This book accepts abstracts of research conducted by undergraduate researchers in the field written on Music, Dance, Visual Arts and Social Science. The review process is used to review abstracts. The editor in chief reserves the right to request authors to revise their abstracts according to the comments made by the reviewers and reserves the right to refuse the publication of the abstracts.

The authorship of the abstracts herein rests alone with the respective undergraduates and is not the responsibility of the editor or the publisher.

© 2021 C. de S. Kulathilake Archival and Research Unit. The publication follows the rules of open access license CC BY-NC-ND.

**ISBN 978-624-5785-05-6**

**Editor-in-Chief** -D. Chanaka Peiris (Senior Lecturer)

**Assistent Editor** - Niluka D. Thilakarathne (Scientific Assistant)

**Page layout** - D. Chanaka Peiris (Senior Lecturer)

**Cover Design** - thxnura.labs

**Panel of Reviewers**

Snr. Lec. D. Chanaka Peiris

Snr. Lec. Nishoka Sadaruwan

Snr. Lec. Mahinda Wimalasiri

Snr. Lec. Saman Kumarathunga

Snr. Lec. Dr. Iranga Samindani

Snr. Lec. Kamani Samarasinghe

**Panel of Evaluation**

Music
- Dr. Anura Rathnasekara(Chair)
- Dr. Ruvin Rangith Dias
- Dr. Chinthaka Maddegoda

Folklore and Culture
- Asso. Prof. Ranjith Fernando (Chair)
- Dr. Iranga Samindani
- Lec. Mahinda Kumara Dalupotha

Applied Arts & Communication
- Snr. Lec. Mahinda Senevirathne(Chair)
- Prof. Lasanthi Manaranjani
- Snr. Lec. Sarath Fernanado

Psychology & Social Science
- Prof. Praneeth Abesundara(Chair)
- Snr. Lec. Mrs. Kamani Samarasinghe

Dance
- Prof. Sriyani Rajapaksha(Chair)
- Snr. Lec. Mahinda Wimalasiri
- Snr. Lec. Saman Kumarathunga

# MUSIC

සංගීත භාණ්ඩවලට උචිත රාග පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්
(බටනලා, සන්තූර්, සිතාර් ඇසුරින්) 09

ඩී. ඇම්. චාමලී ප්‍රමුදිකා

පූර්ව ප්‍රසව අවධියේ පසු වන මව්වරුන් ගේ මානසික ව්‍යාකූලතා සමනය
සඳහා සංගීත භාවිතය 10

ඩබ්. ලක්ෂාණි සේනාරත්න

ජහුටා හෙවත් දෙබස් කථන මුද්‍රා ගීත නාටක කලාවෙහි සංගීත පසුබිම 11

එල්. ඉමේෂා ප්‍රබෝදනී විජේසූරිය

අග්නි ඔපෙරවෙහි දේශීය ජන මූලාශ්‍රය භාවිතය 12

තිළිණි කාරියවසම්

රාග සහ රස-භාව අනුකලනයෙහි ඛ්‍යාල් ගීතවල සාහිත්‍යික බලපෑම. 13

ඒ. ජී. ඩී. නිසංසලා

සිංහබාහු නාට්‍යයේ සංගීත භාවිතය 14

ඩබ්. එස්. නිර්මාණි විදානගේ

The scope of Violin playing styles: A study based on various music genres
that a violinist can experiment 15

A. M. Sanduni Vishaka Amarakoon

# සංගීත භාණ්ඩවලට උචිත රාග පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

## (බටනලා, සන්තූර්, සිතාර් ඇසුරින්)

ඩී. ඇම්. චාමලී ප්‍රමුදිකා
උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය
සංගීත පීඨය

සංගීත ශිල්පියා හා ශ්‍රාවකයා තුළ යම්කිසි නීති-රීති පද්ධතියකින් භාවයක් සහ රංජනයක් ඇති කෙරෙන විශිෂ්ට වූ නාද මාලාව රාගය යි. නිර්මාණයන්හි සීමාවක් නොමැති වීම රාගධාරී සංගීතයේ විශේෂ ලක්ෂණයකි. පවතින රාග වර්ගීකරණ බොහෝවක් නිර්මාණය වී ඇත්තේ සංගති, වාදී-සංවාදී ස්වර, ස්වර සංවාද, ප්‍රකෘති, මීන්ඩ්, රාගාංග, බහුල ව ඇසුරු කෙරෙන සප්තක, ලය ප්‍රයෝගය, රාග ස්වරූප ප්‍රකාශනයෙහි දීර්ඝ බව හෝ සංක්ෂිප්ත බව, රාගයේ චලනය ආදී කරුණු මූලික කරගෙන ය. වාද්‍ය භාණ්ඩයේ වාදන ශෛලියට අනුව වඩාත් උචිත රාග පවතින්නේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. වාද්‍ය භාණ්ඩ වාදනයේ දී රාගයේ රස-භාව වඩාත් හොඳින් මතු කරගනිමින් වාදනය කිරීමේ හැකියාවන් පිළිබඳ අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ ය. පර්යේෂණ සීමාව වශයෙන් බටනලා, සන්තූර්, සිතාර් යන වාද්‍ය භාණ්ඩ තෝරාගැනුණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය පර්යේෂණය සඳහා යොදාගැනුණ අතර පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ ව ග්‍රන්ථ සහ අන්තර්ජාලය පරිශීලනයෙන් ද, විෂය ප්‍රවීණයන් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා ඇසුරින් ද එක් රැස් කෙරුණු තොරතුරු විග්‍රහයෙන් අවසන් නිගමනයට එළඹිණි. රාග වාදනයේ දී සිතාරයෙහි ඇඟිලි හැසිරවීම සහ සන්තූරයෙහි වයනාධාරකය හැසිරවීම ඇතැම් රාග වාදනයේ දී පහසුවක් මෙන් ම රාගයට අවශ්‍ය භාවය ද වඩාත් උචිත අයුරින් ලබාදෙයි. බටනලාව සඳහා මධ්‍යමයේ සිට පංචමය දක්වා මීන්ඩ් නොයෙදෙන ඖඩව ජාති රාග ද, සන්තූරය සඳහා මීන්ඩ් සහ ගමක් බහුල ව නොයෙදෙන සරල රාග ද, සිතාරය සඳහා සම්පූර්ණ ජාති රාග ද වාදනය සඳහා තෝරාගැනීම වඩාත් උචිත බව මෙම පර්යේෂණයෙන් මතු කරගත හැකි වුණු කරුණු ය. මේ අනුව ඒ ඒ භාණ්ඩයට උචිත රාග තෝරාගෙන වාදනය කිරීමෙන් වාදන භාණ්ඩයට අදාල ව විසංගති අවම කරගනිමින් රාගයේ රස-භාව වඩාත් හොඳින් මතු කරගැනීමට හැකියාව ලැබෙන බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: වාද්‍ය භාණ්ඩ, වාදන ශෛලිය, රාගධාරී සංගීතය, උචිත, මීන්ඩ්*

# පූර්ව ප්‍රසව අවධියේ පසු වන මව්වරුන් ගේ මානසික ව්‍යාකූලතා සමනය සඳහා සංගීත භාවිතය

ඩබ්. ලක්ෂාණි සේනාරත්න

උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය

සංගීත පීඨය

අතීත පවුල් සංස්ථාව තුළ මව සඳහා පැවරී ඇති කාර්ය භාරය ඇයට එතරම් සංකීර්ණ නො වී ය. නමුත් වර්තමාන කාන්තාව විවිධ ජීවිත අවධි පසු කර අධ්‍යාපනය, රැකියාව වැනි සමාජීය බලපෑම් පූර්ණය කළ පසු මාතෘත්වයට සුදුසු කාල පසු වීමත් සමඟ විවාහ දිවියට එළඹීම සිදු වෙයි. එමඟින් ඇති වන කායික අපහසුතා, මානසික ආතති නිසා පැන නඟින ගැටලු මවකට සෘජු ලෙස ම පීඩාකාරී තත්ත්ව උදා කරයි. වර්තමානය වන විට සංගීතයෙන් මානසික ව්‍යාධි සුව කිරීමේ හැකියාවක් ඇති බව ඇතැම් විද්‍යාඥයින් විසින් විවිධ පර්යේෂණ ඇසුරින් කරුණු හෙළිදරව් කොට ඇත. මෙය ඖෂධීය ප්‍රතිකාරවලට අමතර ව ශරීරයට බැහැරින් ලබාදෙන යහපත් මනෝ උත්තේජනයකි. පූර්ව ප්‍රසව අවධියේ පසු වන මව්වරුන් ගේ මානසික ව්‍යාකූලතා සමනය සඳහා චිකිත්සක ක්‍රමයක් ලෙස සංගීතය භාවිත කළ හැකි ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව ය. පූර්ව ප්‍රසව අවධියේ පසු වන මව්වරුන් ගේ මානසික ව්‍යාකූලතා සඳහා සෘජු ව ම බලපාන ගැටලු සොයාබැලීම සහ මව්වරුන් ගේ මානසික ව්‍යාකූලතා සමනය කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙහි අරමුණු ය. මෙහි දී ගුණාත්මක හා ප්‍රමාණාත්මක මිශ්‍ර ක්‍රමවේදය භාවිත කෙරිණි. ග්‍රන්ථ, පුවත්පත්, ලිපි ලේඛන හා අන්තර්ජාල වෙබ් අඩවි පරිශීලනයෙන් ද, වරකාපොල නගරයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පූර්ව ගර්භණී සායන සඳහා සහභාගී වූ මව්වරුන්ගෙන් ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මඟින් ලබාගත් දත්ත, වගු හා ප්‍රස්තාර ඇසුරින් විශ්ලේෂණය කෙරිණි. සංගීතයට සවන්දීමට පෙර හා පසු ආතති තත්ත්ව මැන බැලීමට ආතති පරිමාණයක් (Perceived stress scale) භාවිත කළ අතර බහුතරයක් මව්වරුන් ගේ ප්‍රතිචාරය වූයේ සංගීතයට සවන්දීමෙන් අනතුරු ව ආතති තත්ත්ව සමනය වූ බව යි. දත්ත විශ්ලේෂණයට අනුව සංගීතය ශ්‍රවණයෙන් බහුතරයක් මව්වරුන් ගේ ආතති තත්ත්ව සමනය වී ඇති බව දක්නට ලැබුණි. මේ අනුව මව්වරුන් ගේ මානසික සුවතාව නංවාලීම සඳහා පූර්ව ගර්භණී සායන තුළ සංගීතමය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉතා යෝග්‍ය බව යෝජනා කළ හැකි ය.

*ප්‍රමුඛ පද: පූර්ව ප්‍රසව අවධිය, මානසික ව්‍යාකූලතා, මානසික සුවය, මාතෘ ආතතිය, සංගීත චිකිත්සාව*

# ජහුටා හෙවත් දෙබස් කථන මුද්‍රා ගීත නාටක කලාවෙහි සංගීත පසුබිම

එල්. ඉමේෂා ප්‍රබෝදනී විජේසූරිය
සංගීත විද්‍යා අධ්‍යයනාංශය
සංගීත පීඨය

ශ්‍රී ලාංකේය රංග සම්ප්‍රදායන් පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී වැඩි අවධානයක් හිමි නොවන, වයඹ පළාතට ආවේණික රංග සම්ප්‍රදායක් ලෙස ජහුටා හෙවත් දෙබස් කථන මුද්‍රා ගීත නාටක කලාව හඳුන්වාදිය හැකි ය. ආගමික පසුබිමක් මුල් කරගනිමින් ආරම්භ කරන ලද රංග සම්ප්‍රදායක් වීම හා සාමාන්‍ය ගැමි ජනතාව අතරින් ම නිර්මාණය වී ප්‍රචලිත වූ රංග සම්ප්‍රදායක් වීම නිසා ජහුටා රංග වින්‍යාසය මෙන් ම එය රඟ දැක්වීම සඳහා මුල් වූ අරමුණු මෙරට අන් රංග සම්ප්‍රදායන් අතුරින් සුවිශේෂී ස්ථානයක් හිමි කරගනී. වර්තමානය වන විට ආරම්භක යුගයේ දී නාට්‍ය සතු ව පැවති සංගීතමය ලක්ෂණ විවිධ වෙනස්කම්වලට භාජනය වී ඇති ද යන්න පර්යේෂණ ගැටලුව යි. රංග සම්ප්‍රදායෙහි ආරම්භය හා විකාශය, එහි ස්වභාවය මෙන් ම සංගීතමය පසුබිම පිළිබඳ ව අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණු වෙයි. පර්යේෂණ නියැදිය ලෙස කුරුණෑගල ප්‍රදේශය තුළ ස්ථාපිත නාට්‍ය කණ්ඩායම් හතරක් තෝරාගැනුණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් ද නාට්‍ය හා සම්බන්ධ විවිධ පාර්ශව සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හා සහභාගීත්ව නිරීක්ෂණ ඇසුරෙන් ද තොරතුරු එක් රැස් කෙරිණි. මෙම රංග සම්ප්‍රදාය වර්තමානය වන විට මුදල් ඉපයීමේ අරමුණින් ම රඟ දක්වන නිසා මුල් යුගයේ දී පැවති සංගීතමය කරුණු ක්‍රමයෙන් අභාවයට පත්වීම, මුදල් ඉපයීමේ අරමුණින් නව අංග කීපයක් නාට්‍ය සඳහා එකතු වීම, නාට්‍යය රඟ දැක්වූ මූලික ම අරමුණ වූ ගැමි ජනතාව ඥානනය කිරීම ක්‍රමයෙන් බැහැර වීම ආදී කාරණා නිරීක්ෂණය විය. රංග සම්ප්‍රදායේ ඇති වටිනාකම පිළිබඳ ව හොඳ අවබෝධයක් ඇති නමුත් සිය ජීවිකාව සරි කරගැනීමට තරම් ආදායමක් ඉන් නොලැබෙන බැවින් වර්තමාන ශිල්පීන් මෙවැනි ක්‍රියාකාරකම්වල නියැලෙන බව පෙන්වාදිය හැකි ය. එය රංග සම්ප්‍රදාය සඳහා අහිසි ලෙස බලපායි. රංග සම්ප්‍රදායේ ආරම්භක ශිල්පීන් ඇසුරු කළ පරම්පරා තවමත් ජීවත් ව සිටින බැවින් ශිල්පීන් හට අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබාදී සිය ජීවන මට්ටම නගාසිටුවීමට කරයුතු කිරීමෙන් මෙම රංග සම්ප්‍රදාය යථා ස්වභාවයෙන් ම පවත්වාගෙන යාමටත්, දෙ වන පරම්පරාවක් නිර්මාණය කිරීමටත් හැකි ය.

*ප්‍රමුඛ පද: ජහුටා, සාම්ප්‍රදායික, සංගීතය, වාණිජකරණය, අනුග්‍රහය*

# අග්නි ඔපෙරවෙහි දේශීය ජන මූලාශ්‍රය භාවිතය

තිළිණි කාරියවසම්
මානවවංශ සංගීත විද්‍යා අධ්‍යයනාංශය
සංගීත පීඨය

16 වන සියවසේ ඉතාලි ජාතික මොන්ටි වර්ඩ් විසින් ආරම්භ කොට ජර්මන් ජාතික ග්ලූක් විසින් වැඩිදියුණු කරන ලද ඔපෙරාව ගීත නාටක විශේෂයකි. බටහිර ඔපෙරාවේ ලංකාගමනය සිදු වුයේ ප්‍රේමසිරි කේමදාස ගේ මානසවිල, අග්නි, දොරමඩලාව හා සොඳුරු වර්ණදාසි යන දේශීය ව නිර්මාණය වූ ඔපෙරා මඟිනි. කේමදාස ගේ එම නිර්මාණ අතරින් අග්නි ඔපෙරාව අධ්‍යයනය කරමින් මෙම පර්යේෂණය සිදු කෙරිණි. ප්‍රවීණ සාහිත්‍යධර එරික් ඉලයප්ආරච්චි අග්නි ඔපෙරා පිටපත් රචකයා වේ. ගින්නට අධිපති දෙවි වූ ප්‍රොමිතියස් විසින් පුරාතන හිම යුගයේ මිනිසුන් වෙනුවෙන් ගින්දර ලබාදුන් ආකාරය අග්නි ඔපෙරාවේ කතා වස්තුව වේ. අග්නි ඔපෙරාව සඳහා දේශීය ජන මූලාශ්‍රය භාවිත වූයේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. ශ්‍රී ලංකේය නිර්මාණකරුවන් අතින් ඔපෙරා නිර්මාණය වීමේ දී දේශීය ජන මූලාශ්‍රය ඇසුර නිතැතින් ම එම නිර්මාණයට සම්බන්ධ වෙතැ යි යන්න මෙහි උපන්‍යාස කරගැනුණි. අග්නි ඔපෙරාව පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කිරීම අරමුණ යි. මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිතයට ගැනුණි. ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් ද, විෂයේ ප්‍රවීණයන් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා සහ අන්තර්ජාල පරිශීලනයෙන් ද ලබාගත් තොරතුරු ඇසුරෙන් අවසාන ප්‍රතිඵලයට නිගමනයට එළඹිණි. අග්නි ඔපෙරාවෙහි කෙළි ගී, පසම් ගී, කන්තාරු ගී, පහතරට ශාන්තිකර්ම සම්ප්‍රදායේ සුරඹා වල්ලිය පෙලපාලියේ ගී, නාඩගම් ශෛලියේ ඉන්නියස යන කවි නාදමාලා ඇසුර සමඟ පහතරට යක් බෙරය හා තම්මැට්ටම් පද භාවිත කර දේශීය ජන නාදමාලා හා දේශීය ජන සංගීත භාණ්ඩ, බටහිර සංගීත ශිල්පක්‍රම සමඟ මනා ලෙස සුසංයෝග කර ඇති බව පැහැදිලි විය.

*ප්‍රමුඛ පද: අග්නි ඔපෙරාව, ජන සංගීතය, දේශීය ඔපෙරා, සංගීත සංධ්වනි, ප්‍රේමසිරි කේමදාස.*

# රාග සහ රස-භාව අනුකලනයෙහි ඛ්‍යාල් ගීතවල සාහිත්‍යික බලපෑම

ඒ. ජී. ඩී. නිසංසලා
උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය
සංගීත පීඨය

උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීත සම්ප්‍රදායෙහි ප්‍රචලිත ගායන ශෛලියක් ලෙස ඛ්‍යාල් හැඳින්විය හැකි ය. රාග රස භාවෝද්දීපනයෙහි ලා ඛ්‍යාල් ගීතාර්ථයන්හි බලපෑමක් තිබේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. ඛ්‍යාල් ප්‍රබන්ධවලින් කියැවෙන ප්‍රස්තුත සහ ඛ්‍යාල් ප්‍රබන්ධ හා රාගයේ රස අතර පවත්නා සම්බන්ධතාව අධ්‍යයනය කිරීම මෙහි අරමුණු ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මෙම අධ්‍යයනය සඳහා යොදාගැනුණ අතර ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් ද, විෂයය ප්‍රවීණයන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා මඟින් ද ලබාගත් තොරතුරු විග්‍රහයෙන් අවසාන නිගමනයට එළඹිණි. මෙම පර්යේෂණය සඳහා කාෆී, ඛමාජ්, මාලකෞන්ස්, යමන්, භෛරවී යන රාග පමණක් තෝරාගැනුණි. ඛ්‍යාල් ප්‍රබන්ධ හින්දී, බ්‍රජ්, උර්දු ආදි භාෂාවන්ගෙන් රචනා වී ඇත. එක් රාගයක් සඳහා නිර්මාණය වී ඇති ඛ්‍යාල් ගීත බොහෝවක් ඇත. එමෙන් ම පොදු ප්‍රස්තුත මෙන් ම විවිධ ප්‍රස්තුත පදනම් කොටගෙන නිර්මාණය වූ ඛ්‍යාල් ප්‍රබන්ධ ද දක්නට ඇත. රාගයක පවත්නා අනන්‍ය ලක්ෂණ රාගයේ රස-භාව නිර්මාණය කරන්නට මූලික වන බවත්, රස-භාව තීව්‍ර කිරීමට ඛ්‍යාල් ගීතාර්ථය සංයෝග වීම බලපාන බවත් පර්යේෂණයේ දී සනාථ විය. ඛ්‍යාල් ශෘංගාරාත්මක ගායන ශෛලියක් ලෙස ප්‍රචලිත ය. නමුත් රාගයක අනන්‍යතාව ගායනයෙන් ඉස්මතු කර දක්වීමේ දී විවිධ රස-භාව උද්දීපනය කෙරෙන බවත්, ඛ්‍යාල් පද සාහිත්‍යයෙන් ඉස්මතු කෙරෙන රස රාගය සමඟ සංයෝග වීමේ දී රාගයක ආවේණික රස-භාව වෙනස් වන අවස්ථා ඇති බවත්, රාගයක අනන්‍ය රස-භාව ඉස්මතු වන අයුරින් ඛ්‍යාල් ප්‍රබන්ධ රචනා කිරීමෙන් වඩාත් සාර්ථක ලෙස රාග රස-භාව උද්දීපනය කළ හැකි බවත් මෙම පර්ය්ෂණයේ දී පැහැදිලි විය. මේ අනුව රාගයක රස-භාව උද්දීපනය කෙරෙහි ඛ්‍යාල් ගීතාර්ථය බලපාන බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: උත්තර භාරතීය සංගීතය, ඛ්‍යාල්, ඛ්‍යාල් ගීතාර්ථය, රස-භාව, රාග*

# සිංහබාහු නාට්‍යයේ සංගීත භාවිතය

ඩබ්. එස්. නිර්මාණි විදානගේ
උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය
සංගීත පීඨය

නාට්‍ය සංගීතය යනු කිසියම් නාට්‍යයක මුඛ්‍ය රස තීව්‍ර කරන අනුශංගික කලාවකි. එදිරිවීර සරච්චන්ද්‍ර සිය නාට්‍ය දෘෂ්ටිය පෝෂණය කරගැනීම සඳහා සංගීතය ප්‍රධාන මෙවලමක් ලෙස භාවිත කර ඇත. සිංහබාහු නාට්‍යයෙන් මානව සබඳතා තුළ ඇති ගැඹුරු සංකීර්ණ බව සහ සබඳතා බිඳීයෑමෙන් පුද්ගලයා පත් වන වික්ෂිප්ත ස්වභාවය නිරූපණය කර ඇත. දාරක ප්‍රේමය පසුබිම් කරගෙන උද්දීප්ත කර ඇති පරම්පරා ගැටුම යන සංකල්පය නාට්‍යයේ ගුරු අර්ථය වේ. සරච්චන්ද්‍ර නාඩගම් සංගීතය මෙන් ම භාරතීය සහ දේශීය ජන සංගීත ආභාසය ලබමින් සිංහබාහු නාට්‍යයේ සංගීතය නිර්මාණය කර ඇත. මෙම නාට්‍යයේ සංගීත සංකලනයෙන් එහි මුඛ්‍ය තේමාව ඉස්මතු වන්නේ ද යන්න පර්යේෂණ ගැටලුව වේ. නාට්‍යයේ සංගීතය නිර්මාණය කිරීමට ආභාසය කරගත් සංගීත පද්ධති පිළිබඳ ව අධ්‍යයනයේ යෙදීම පර්යේෂණ අරමුණ යි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය, අන්තර්ජාලය භාවිතය, සජීවී ව සිංහබාහු නාට්‍යය නැරඹීම සහ විෂය ප්‍රවීණයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් තොරතුරු එක් රැස් කරගැනුණි. මෙම නාට්‍යයේ සංගීතය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී පැරණි නාඩගම් තනු, නාඩගම් සම්ප්‍රදායෙහි දක්නට ලැබෙන වාසගම්, උරුට්ටු, අසාරණ්, වැනි ලක්ෂණ මෙන් ම දේශීය දරු නැළවිලි ගී තනු, ප්‍රශස්ති ලක්ෂණ සහ හින්දුස්ථානී සංගීතයේ රාග ඡායාවන් ද මතු වී ඇති බව නිරීක්ෂණය විය. සිංහබාහු නාටයයේ සංගීතය නාට්‍යයේ මුඛ්‍ය තේමාව උද්දීප්ත වන අයුරින් වත්මන් වේදිකාවට ගැලපෙන ලෙස නාට්‍යෝචිත ව නිර්මාණය කර ඇති බව පැවසිය හැකි ය.

*ප්‍රමුඛ පද: නාට්‍ය සංගීතය, නාඩගම්, සිංහබාහු, උරුට්ටුව, ප්‍රශස්ති*

# The scope of Violin playing styles: A study based on various music genres that a violinist can experiment

A. M. Sanduni Vishaka Amarakoon
Department of Western Music
Faculty of Music

According to literature, the violin had been a very popular musical instrument since the 16th century. It has not been limited to one culture. A violinist has the freedom to experiment with many styles of violin playing without restricting himself to only one genre of music. However, this is favourable for a violinist who has reached a higher competency level of playing. In other words, the individual has to take guidance from a teacher under one genre for a comparatively longer period of time. This qualitative research seeks to find necessary technical studies for a violin player to achieve proficiency in adapting to many musical genres. The researcher focuses on the styles such as western and North Indian classical, jazz, Sri Lankan light music and the Armenian style of playing. The objectives of this study were to establish a firm ground on which a violinist can play different styles as the ones stated above within a shorter period of time and to educate violinists on ways to adapt to play formerly mentioned styles. The researcher used methods such as observation of different violin players, and self-studying on applying techniques of both the left and right hands. Through the research findings, it could be proved that by using certain techniques, a single violinist can adapt to many genres without abiding by one style of playing within a shorter period of time.

*Keywords: genres, violin, playing styles, techniques,*

# FOLKLORE AND CULTURE

දේශීය ඖෂධීය තෙල් නිෂ්පාදන ක්‍රියාවලිය හා නැකත් ක්‍රම 19

ඩබ්ලිව්. ඒ. සඳලි ධනූෂි ජයසූරිය

කේන්ද්‍ර ගැළපීමෙහි නූතන සමාජීය ස්වරූපය 20

ජී. කේ. ගුණවර්ධන

එකගෙයි කෑම විවාහ ක්‍රමයේ පැවති නෛතිකභාවය 21

එල්. ජී. දික්මාදුගොඩ

කතරගම දේවාලය හා බැඳි කප් සිටුවීමේ චාරිත්‍රයේ සංඥාර්ථ සංකල්පය 22

කේ. ජී. ආර්. කාවින්දි

සෙත් කවි ගායනය සහ අධ්‍යතන සමාජ පිළිගැනීම 23

ඩබ්. ජී. දිශ්නා කුමාරි

ශ්‍රී ලාංකේය සමාජයේ කිලි සංකල්පය
(මහරගම නගරය ඇසුරෙන්) 24

එච්. ඩී. අයි. එස්. එස්. ජයතිස්ස

# දේශීය ඖෂධීය තෙල් නිෂ්පාදන ක්‍රියාවලිය හා නැකත් ක්‍රම

ඩබ්ලිව්. ඒ. සඳලි ධනූෂි ජයසූරිය
නර්තන රංගකලා ඉතිහාසය හා සිද්ධාන්ත අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

දේශීය ආයුර්වේදයෙහි තෙල් නිෂ්පාදන ක්‍රියාවලිය හා බැඳි නැකත් භාවිතය බහුල ව සිදු කෙරෙන අතර චන්ද්‍රමාස සම්ප්‍රදායට අනුව නැකත් සැකසෙයි. ඇතැම් තෙල්, කුකුළන් හැඬලීමට පෙර සිඳ අවසන් කළ යුතු බවටත්, භාවිත කරන ඖෂධ තෝරාගත් පිරිසිදු ස්ථානවලින් ලබාගත යුතු බවටත් නියමයන් පවතී. නැකත් ශාස්ත්‍රය පදනම් කරගෙන පිළියෙල කරන තෙල්වලින් රෝගියාට වඩා යහපත් ප්‍රතිඵල අත්කර දෙන්නේ ද යන ගැටලුව පර්යේෂණයට නතු වේ. නැකතට සිඳ අවසන් කළ තෙල් භාවිතයෙන් ඇති වන ක්‍රියාවලිය රෝග සමනයට බලපාන ආකාරය අධ්‍යයනය කිරීම පර්යේෂණ අරමුණ වේ. **භෘංගමාලක, පාඨා, නීලයාදී** යන තෛල ත්‍රිත්වය මුල් කොටගෙන පර්යේෂණ සිදු කෙරිණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරුණු අතර ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනයෙන් ද, ආයුර්වේදය පිළිබඳ ප්‍රවීණයන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා මඟින් ද ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ද තොරතුරු එක් රැස් කෙරිණි. එක ම වට්ටෝරුවට සාදාගත් එක ම තෙල් වර්ගය නැකතට හා නැකත උපයෝගී නොකොට සිඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කෙරිණි. නැකතට සිඳින තෙලෙහි ගුණාත්මක මට්ටම ඉහළ අගයක් ගන්නා බවත්, ඒ සඳහා පාරිසරික සාධක බලපා ඇති බවත් අධ්‍යයනයෙන් තහවුරු විය. මේ අනුව නැකතට පිළියෙළ කරන ඖෂධීය තෙල්වල ඉහළ ඖෂධීය ගුණයක් ඇති බවත්, ඒවා රෝගීන්ට ප්‍රත්‍ය වන බවත් නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද:* ආයුවේද වෛද්‍ය විද්‍යාව, ඖෂධීය තෙල්, ප්‍රයෝජ්‍යතා, නැකත් ශාස්ත්‍රය, චන්ද්‍ර මාස සම්ප්‍රදාය

# කේන්දර ගැළපීමෙහි නූතන සමාජීය ස්වරූපය

ජී. කේ. ගුණවර්ධන
උඩරට නර්තන අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

විවාහය යනු පවුල් ඒකක දෙකක ජීවත් වූ අසමාන ගතිගුණ සහ අදහස් ඇති දෙදෙනෙක් කායික, මානසික සහ සමාජීය වශයෙන් එක පවුලක් ලෙස ජීවිතය ඇරඹීම යි. යෞවන-යෞවනියන් කායික සහ මානසික තෘප්තියක් ලැබ එමඟින් ගුණගරුක සමාජයක් ගොඩනැංවීම විවාහයේ ප්‍රධානතම පරමාර්ථය වේ. ශ්‍රී ලංකාවේ සිංහල සහ හින්දු ජාතිකයෝ වැඩි දෙනෙකු යොජිත විවාහයක් වුවත්, ආදර සම්බන්ධතාවක් වුවත් ජ්‍යෝතිෂයට අනුව තම හඳහන අනෙකා හා ගැලපෙනු දැ යි කල්තියා දැනගැනීමට උත්සුක වෙති. අතීතයේ සිට ම පැවතගෙන එන මෙම පොරොන්දම් ගැලපීමේ චාරිත්‍රය වර්තමානයේ ද දක්නට ඇත. කේන්දර ගැලපීමෙහි නිරවද්‍යතාවක් පවතී ද යන්න පර්යේෂණ ගැටලුව ය. වත්මන් සමාජයෙහි කේන්දර ගළපා විවාහ සිදු වුණ ද ඇතැම් විවාහයන් දික්කසාදයකින් අවසන් වේ. නමුත් කේන්දර ගැලපීමක් නොකර සිදු වූ ඇතැම් විවාහ සාර්ථක වී ඇත. කේන්දර ගැළපීමෙන් සිදු කෙරෙන විවාහ කොතෙක් දුරට සාර්ථක ද යන්නත්, කේන්දර නොගැළපීමෙන් සිදු වූ විවාහය කොතෙක් දුරට අසාර්ථක ද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ ය. මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල ප්‍රදේශය ආශ්‍රිත ව මෙම පර්යේෂණය සිදු කෙරිණි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් ද, සම්මුඛ සාකච්ඡා සහ තෝරාගත් පිරිසක් වෙත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීමෙන් ද රැස් කරගත් තොරතුරු හා දත්ත විශ්ලේෂණය කොට අවසාන නිගමනයට එළඹිණි. කේන්දර පිළිබඳ සැලකිලිමත් නො වී යහපත් විවාහ ජීවිත ගත කරන අය ගේ පොරොන්දම් පර්යේෂා කිරිමේ දී ඔවුන් නොදැනුවත් ව ම ඒවා ඉතා ප්‍රශස්ත මට්ටමකින් ගැළපි තිබුණු අතර එලෙස විසිපොරොන්දම් සියුම් ව පරීක්ෂා කොට සිදු වූ විවාහ සාර්ථකත්වයට පත් වී ඇති බව නිරීක්ෂණය විය. මේ අනුව විවාහයකට පෙර සිදු කෙරෙන පොරොන්දම් ගැළපීමේ චාරිත්‍රය හුදෙක් චාරිත්‍රයක් ම පමණක් නො ව එහි විද්‍යානුකූල සත්‍යයක් ඇති බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: ග්‍රහ පිහිටීම, ජෝතීර් විද්‍යාව, දික්කාසාදය, විසි පොරොන්දම්, හතේ නැකත*

# එකගෙයි කෑම විවාහ ක්‍රමයේ පැවති නෛතිකභාවය

එල්. ජී. දික්මාදුගොඩ

නර්තන, රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශය

නර්තන හා නාට්‍ය කලා පීඨය

ශ්‍රී ලංකාවේ උඩරට රාජධානි සමයේ විවිධ පවුල් පසුබිම් තුළ පැවතුණු, මෑත අතීතය වන තෙක් ම නොයෙක් ගම් පළාත්වල දක්නට ලැබුණු **එකගෙයි කෑම** යනු එවකට පැවති සිරිත් අනුව තවත් සාමාන්‍ය විවාහ ක්‍රමයකි. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයත් සමඟ එකගෙයි කෑම පිළිකුල් සහගත සිරිතක් ලෙස හැඳින්වූ අතර එය දීග විවාහ හා බින්න විවාහ තුළ දක්නට තිබිණි. පැරණි උඩරට විවාහ නීති පිළිබඳ අධ්‍යයනයේ දී මේවායේ යම් යම් නෛතික සීමාවල වෙනස්කම් හමු වේ. උඩරට නීතිය වර්තමානය වන විට පෞද්ගලික නීතියක් ලෙස ක්‍රියාත්මක වෙයි. එකගෙයි කෑම සිදු කිරීමට හේතු කාරණා රාශියක් අතීත සමාජ සංස්කෘතිය තුළ පැවතුණි. ඒ අනුව ඊට ම වෙන් වූ සාම්ප්‍රදායික රීති, සිරිත් සහ තහංචි වශයෙන් ගැමි සමාජයේ ක්‍රියාත්මක විය. එවකට රජු විසින් එකගෙයි කෑමේ විවාහ ක්‍රමය සම්බන්ධයෙන් නීති පනවාතිබුණේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. මේ සඳහා කිසියම් පිළිගත් නීතියක් තිබුණ බව උපන්‍යාසය වේ. පර්යේෂණයේ අරමුණ වන්නේ එකගෙයි කෑමේ විවාහ ක්‍රමය සඳහා ලිඛිත නීති කුමන ආකාරයට පැවතියේ දැ යි සොයාබැලීම ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරුණු අතර ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනයෙන් ද, ජනශ්‍රැතිවේදීන් හා නීතිඥයන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා මඟින් ද ලබාගත් තොරතුරු විග්‍රහයෙන් අවසාන නිගමනයට එළඹිණි. මෙම අධ්‍යයනයේ දී එකගෙයි කෑම සම්බන්ධ ව පැවති නීති මඟින් එවකට සමාජය තුළ පූර්ණ රැකවරණයක් මෙන් ම සමාජ සම්මුතියක් පැවති බවට නිරීක්ෂණය විය. මේ අනුව එකගෙයි කෑම විවාහ චාරිත්‍රය යම් නීතිමය රාමුවක් තුළ රැකවරණය ලැබූ එකල සමාජ සම්මත වූ විවාහ ක්‍රමයක්  ව පැවති බව පැහැදිලි වන කරුණකි.

*ප්‍රමුඛ පද: විවාහ, පවුල, සිරිත් විරිත්, එකගෙයි කෑම, නීති*

# කතරගම දේවාලය හා බැඳි කප් සිටුවීමේ චාරිත්‍රයේ සංඥාර්ථ සංකල්පය

කේ. ජී. ආර්. කාවින්දි
නර්තන රංග කලා ඉතිහාස හා සිද්ධාන්ත අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

රාජ මන්දිර වැනි විශාල වූත්, ගෞරවනීය වූත් ගොඩනැගිලි කර්මාන්ත ආරම්භ කිරීමේ දී සහ විශාල පෙරහැර, උත්සව, ආරම්භ කිරීමේ දී කප් සිටුවීම පුරාණයේ සිට පැවත එන සම්ප්‍රදායකි. කප් සිටුවීමෙන් බලාපොරොත්තු වන්නේ අපේක්ෂිත කටයුත්ත සාර්ථක ව නිම කරගැනීම සඳහාත්, එහි නියැලෙන්නන්ට පැමිණිය හැකි අපල උපද්‍රව සහ වස්-දොස් දුරු කරගැනීම සඳහාත්, දේවාශීර්වාදය ලබාගැනීමට යි. එක් අතකින් එයින් දෙවියන්ට වන බාරයක, පොරොන්දුවක ස්වරූපයක් ද පෙන්නුම් කෙරෙයි. බොහෝ විට මෙම චාරිත්‍රය දෙවියන් හා සම්බන්ධ චාරිත්‍රයක් වුව ද මෙහි බෞද්ධාගමික මුහුණුවරක් ද ඇත. කප යන්නෙහි අර්ථය කණුව ය. එය සාමාන්‍ය කණුවක් නො ව ප්‍රධාන කණුව විය යුතු ය. මෙම චාරිත්‍රයෙන් ගම්‍ය වන සංඥාර්ථ සංකල්පය කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වන අතර කතරගම දෙවියන් ගේ ස්වර්ණ මංගල්‍යය නිමිති කරගනිමින් ඇසළ පෙරහැර මංගල්‍යය පවත්වන හෙයින් මෙම කප් සිටුවීමේ චාරිත්‍රය ඒ හා සමානකමක් ගන්නා බව මෙහි උපන්‍යාසය යි. මෙම චාරිත්‍රය සිදු කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය, ඒ පිළිබඳ ව ඇති විශ්වාසය, ගම්‍ය වී ඇති සංඥාර්ථ සංකල්ප පිළිබඳ තොරතුරු රැස් කිරීම පර්යේෂණ අරමුණ යි. ඒ සඳහා කතරගම දේවාලයේ කප් සිටුවීමේ මංගල්‍යය නියැදිය වශයෙන් ගැනුණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මෙම පර්යේෂ්ණ කාර්යය සඳහා යොදාගැනුණ අතර ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් ද, දේවාලයේ කපු මහතෙකු සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවක් මඟින් ද තොරතුරු රැස් කෙරිණි. මෙම චාරිත්‍රය තුළ වෘක්ෂ වන්දනාවේ නෂ්ඨාවශේෂයක් ගැබ් වී ඇති බවත්, එය කතරගම දෙවියන් ගේ හා වල්ලි දෙවඟන ගේ මගුල් මඩුව සැකසීම සංකේතවත් කිරීමක් ලෙසත්, කප සඳහා **රත්කරවු** වැනි ප්‍රරෝහ ශක්තියෙන් යුත් ලීයක් තෝරාගැනීම සජීවී බව සංකේතවත් කිරීමක් බවත් හඳුනාගත හැකි ය.

*ප්‍රමුඛ පද: කප් සිටුවීම, කප, චාරිත්‍රය, දෙවියෝ, සංඥාර්ථ සංකලප*

# සෙත් කවි ගායනය සහ අධ්‍යතන සමාජ පිළිගැනීම

ඩබ්. ජී. දිශ්නා කුමාරි
නර්තන රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

සිංහල සමාජයෙහි කවි පද නිර්මාණය වන්නේ හුදෙක් රසාස්වාදය පිණිස ය. එහෙත් සෙත් කවිය එම රසාස්වාද ගණයට නොවැටෙන අතර යම් අයෙකුට සෙතක්, ශාන්තියක් සහ යම් අරමුණක් උදෙසා ගායනා කෙරෙයි. සෙත් කවි ගායනා කිරීමෙන් මිනිසුන්ට පැමිණෙන නොයෙකුත් දුක්-කරදර, සිත්-තැවුල්, රෝග-පීඩා ආදි බොහෝ දේ සමනය කරගැනීමේ හැකියාවක් පවතී. සිංහල භාෂාවේ භාවිත ශක්ති අක්ෂර මිනිස් මුවඟින් නිකුත් වේ. ඒවා යොදාගෙන විශ්ව ශක්ති ධාරා සකස් කිරීමටත් එමඟින් මානවයාට පැමිණෙන නොයෙක් දුක් ගැහැට නිරාවරණය කරගැනීමටත් හැකියාවක් සැලසෙන සෙත් කවි ශාස්ත්‍රය ශබ්ද විද්‍යාවේ අංගයකි. ගුප්ත විද්‍යාව ඇසුරින් කෙරෙන අභිචාරාත්මක ප්‍රතිකාරයක් වශයෙන් සුදු අභිචාරවලට අයත් සෙත් කවි ගායනයේ දී නිවරදි ව ඝන පිහිටුවා ගායනා කිරීමෙන් අවශ්‍ය යහපත සලසාගත හැකි ය. සෙත් කවි ගායනය පිළිබඳ අද්‍යතන සමාජයේ පිළිගැනීමක් තිබේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. අධ්‍යයතන සමාජයේ සෙත් කවි භාවිත කරන අවස්ථා හා එයින් සිදු වන යහපත අධ්‍යයනය කිරීම පර්යේෂණ අරමුණු වේ. ගුණාත්මක හා ප්‍රමාණාත්මක මිශ්‍ර ක්‍රමවේදය භාවිත කෙරුණු අතර කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රදේශය ආශ්‍රිත ව තෝරාගත් පිරිසක් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි භාවිතයෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය කෙරිණි. දත්ත විශ්ලේෂණයට අනුව නිවරදි ව සෙත් කවි ගායනා කිරීමෙන් සෙතක් සලසාගත හැකි බව අද්‍යතන සමාජයේ බහුතරයක් දෙනා පිළිගන්නා බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: අභිචාර, ගුප්ත විද්‍යාව, විශ්ව ශක්තිය, ඝන පිහිටුවීම, ශබ්ද විද්‍යාව*

# ශ්‍රී ලාංකේය සමාජයේ කිලි සංකල්පය
## (මහරගම නගරය ඇසුරෙන්)

එච්. ඩී. අයි. එස්. එස්. ජයතිස්ස
නර්තන රංගකලා ඉතිහාස හා සිද්ධාන්ත අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

ක්ෂුද්‍ර ජීවී බැක්ටීරියා ක්‍රියාකාරීත්වය අධික නයිට්‍රජන් සහ හයිඩ්‍රජන් තත්ත්වයක් ඇති කිරීමට සමත් ඕනෑ ම පසුබිමක් කිල්ල ලෙස හැඳින්වෙයි. කිල්ල යනු ඔසප් වීම, ඍතු වීම, මාස් ශුද්ධිය, අපවිත්‍රතාව වශයෙන් ද විස්තර කළ හැකි යි. සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මිනිසා නාගරීකරණය හමුවේ පරිවර්තනයකට ලක් වේ. අතීත නොදියුණු සමාජය කිලි සංකල්පය පිළිබඳ ව විශ්වාසයෙන් කටයුතු කර ඇත. අතීත සමාජයේ කිල්ල හා බැඳි සංකල්පය පිළිබඳ ව, අද්‍යතන සමාජයේ ජනයා තුළ ආකල්පමය වෙනසක් සිදු ව තිබේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. භෞතික සංස්කෘතිය ශීඝ්‍රයෙන් වෙනස් වුවත්, කිල්ල හා බැඳි සංකල්ප තවමත් සමාජයේ භාවිත වන බව උපන්‍යාසය යි. අතීත සමාජයේ කිල්ල හා බැඳි සංකල්පය හා අද්‍යතන සමාජය තුළ ඒ කෙරෙහි ඇති වී තිබෙන ආකල්පමය වෙනස හඳුනාගැනීම පර්යේෂණයේ අරමුණ ය. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරුණු අතර ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් ද, අහඹු නියැදි ක්‍රමය යටතේ ලබාදුන් ප්‍රශ්නාවලි ඇසුරෙන් ද, සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් ද ලබාගත් තොරතුරු විග්‍රහයෙන් අවසාන නිගමනයට එළඹුණි. නාගරීකරණය වූ පරිසරයක ජීවත් වුවත්, වැඩිහිටි පරම්පරාව තුළ තවමත් කිලි සංකල්පය පිළිබඳ පෙර පරිදි ම අදහස් හා ආකල්ප පවතින බවත්, වයස, අධ්‍යාපනය, රැකියාව හා සමාජ තත්ත්වය හමුවේ කිලි සංකල්පය පිළිබඳ දරණ අදහස පුද්ගලානුබද්ධ ව වෙනස් වී ඇති බවත් නිරීක්ෂණය විය. තොරතුරු විග්‍රහයට අනුව වත්මන් සමාජයේ මිනිසුන් තුළ කිලි සංකල්පය පිළිබඳ අවධානය අඩු වී ඇති බවත්, ඔවුන් ගේ ආකල්පවල වෙනසක් සිදු ව ඇති බවත් නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: කිල්ල, අතීත සමාජය, නූතන සමාජය, ආකල්පමය වෙනස*

# APPLIED ARTS AND COMMUNICATION

යෝගා සාධනයෙහි සප්ත චක්‍ර - සප්ත චක්‍ර අවදි කිරීම උදෙසා උපයුක්ත වන
උත්තර භාරතීය සංගීතය. 27
බී. එම්. පී. ඩී. බස්නායක

බංකු රබානෙහි සංනිවේදන විධික්‍රම 28
වයි. ජී. ජේ. එල්. ඩී. ගමගේ

භෞතික පරිසරයට උචිත තම්මැට්ටමෙහි නවතම මිනුම් 29
ටී. එච්. එම්. දිනුක උදයන්ත තෙලසිංහ

වෙළඳ දැන්වීම්කරණය තුළ අලෙවි උපක්‍රමයක් ලෙස සංගීත නිර්මාණය සහ භාවිතය
(තෝරාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය බිස්කට් වෙළඳ දැන්වීම් හයක් ඇසුරින්) 30
වයි. ජී. ජේ. එල්. ඩී. ගමගේ

වත්මන් දේශපාලන ප්‍රතිරූප ප්‍රවර්ධනයෙහි ලා දේශීය සංගීතයේ උපයෝගීතාව 31
ඩබ්. ටී. ඩබ්. ආර්. ජයනන්දි

ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය කෙරෙහි ළමා කාව්‍ය ප්‍රබන්ධවල උපයෝගීතාව 32
ආර්. එම්. සමාධි එස්. රත්නායක

සිනමා සංගීතය හා රූප රචනය අතර පවත්නා සහසම්බන්ධතාව 33
එන්. ඒ. ඒ. කුලසූරිය

# යෝගා සාධනයෙහි සප්ත චක්‍ර - සප්ත චක්‍ර අවදි කිරීම උදෙසා උපයුක්ත වන උත්තර භාරතීය සංගීතය.

බී. එම්. පී. ඩී. බස්නායක
සංගීත විද්‍යා අධ්‍යයනාංශය
සංගීත පීඨය

චක්‍රා යනු යෝගා සාධනයේ, ආයුර්වේදයේ සහ සංගීත චිකිත්සාවේ දී භාවිත වන ආධ්‍යාත්මික සංකල්පයකි. භාරතීය ඍෂිවරුන්ට අනුව චක්‍රා තුළ ආවර්තීය ව ඇති වන බලය නිසා ශක්තිය නිපදවෙයි. සප්ත චක්‍රාවන්හි ජෛව විද්‍යාත්මක ක්‍රියාකාරීත්වය සහ සප්ත චක්‍රා අවදි කිරීමට උත්තර භාරතීය සංගීතාංග භාවිත කළ හැකි ද යන්න පර්යේෂණ ගැටලුව යි. උත්තර භාරතීය සංගීතාංග භාවිතයෙන් සප්ත චක්‍රා අවදි කිරීමට උත්තේජනයක් ලබාගත හැකි ය යන්න උපන්‍යාසය යි. සප්ත චක්‍රාවන්හි ජෛව විද්‍යාත්මක ක්‍රියාකාරීත්වය සහ සප්ත චක්‍රා අවදි කිරීමට උපයෝගී කරගත හැකි උත්තර භාරතීය සංගීතාංග අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණු ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරුණු අතර ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් තොරතුරු එක් රැස් කෙරිණි. ශරීරයේ විවිධ ග්‍රන්ථී සහ අවයව සම්බන්ධ වීමෙන් ප්‍රධාන ශක්ති මධ්‍යස්ථාන හතක් නිර්මාණය වේ. චක්‍රා අවදි කිරීමට යෝගා සාධනය, ශ්වසන පාලනය, භාවනාව සහ විවිධ ඉරියව්වලින් ව්‍යායාම කිරීම සිදු කළ හැකි ය. චක්‍රා ආශ්‍රිත ප්‍රධාන අවයව සහ ග්‍රන්ථීවලින් ශ්‍රාවය කරන හෝමෝන නිසා කායික මානසික සමතුලිතතාව ඇති වේ. චක්‍රා අවදි කිරීමට උත්තර භාරතීය සංගීතය උපයුක්ත කරගැනීමෙන් කායික, මානසික රෝග වඩාත් සාර්ථක ලෙස සුවපත් කිරීමට සහ පාලනය කිරීමට හැකියාව පවති. කටහඬෙන් තොර ව වාදන ඛණ්ඩ ද වැඩි වශයෙන් යොදාගැනේ. සප්ත චක්‍රා නම් ආධ්‍යාත්මික සංකල්පයට ජෛව විද්‍යාත්මක ක්‍රියාවලියක් පවතින බවත්, උත්තර භාරතීය සංගීතය උපයුක්ත කරගැනීමෙන් ඉහළ ඵලදායිතාවක් ලබාගැනීමට හැකියාවක් පවතින බවත් නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: සප්ත චක්‍රා, උත්තර භාරතීය සංගීතය, ග්‍රන්ථී, හොමෝන, යෝගා සාධනය*

# බංකු රබානෙහි සංනිවේදන විධික්‍රම

වයි. ජී. ජේ. එල්. ඩී. ගමගේ
මානවවංශ සංගීත විද්‍යා අධ්‍යයනාංශය
සංගීත පීඨය

අත් රබාන හා විරිදු රබාන යන රබන් වර්ගවලට වඩා බංකු රබාන හෙවත් මහ රබානේ විශේෂත්වය වනුයේ කිහිපදෙනෙකු වාදනය කළ හැකි භාණ්ඩයක් වීම ය. ශ්‍රී ලාංකේය භාවිතයේ පවතින විශාලතම අවනද්ධ භාණ්ඩය වශයෙන් හැඳින්විය හැකි බංකු රබාන සිංහල අවුරුදු උත්සව සහ විවාහ මංගල උත්සවවල දී ප්‍රධාන ස්ථානයක් ගන්නා භාණ්ඩයක් වශයෙන් පිළිගැනේ. දැනට දශක කීපයක සිට සංනිවේදන විධික්‍රමයක් ලෙස විවාහ මංගල්‍ය හා අවුරුදු උත්සවවල දී භාවිත බංකු රබන් වාදනය නාගරීකරණයත් සමග පෙර ලෙස භාවිත වේ ද යන්න පර්යේෂණ ගැටලුව ය. බංකු රබාන නම් වාද්‍ය භාණ්ඩය පිළිබඳ අධ්‍යයනය කිරීම සහ සංනිවේදන විධික්‍රම හඳුන්වාදීම මෙම පර්යේෂණයේ අරමුණ යි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදු කෙරුණු අතර තෝරාගත් වැඩිහිටි පුද්ගලයන් 10 දෙනෙකු සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡා සහ සාහිත්‍යාගත මුලාශ්‍රය පරිශීලනයෙන් තොරතුරු එක් රැස් කෙරිණි. වර්තමාන නව තාක්ෂණයේ ආගමනය, උත්සව ශාලා ඉදි වීම, නිවැසියන් ගේ කාර්ය බහුලත්වය, සාම්ප්‍රදායික සංනිවේදන විධික්‍රම කෙරෙහි තරුණ පරම්පරාව විශ්වාස නොකිරීම යන කරුණු හේතු කොටගෙන බංකු රබන් වාදනය සංනිවේදන විධික්‍රමයක් ලෙස අද්‍යතනයේ නාගරික සමාජය තුළ භාවිතයෙන් ඈත් ව පවතින බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: බංකු රබාන, කාර්යබහුලත්වය, සම්ප්‍රදාය, සංනිවේදන විධික්‍රම, අවුරුදු උත්සව*

# භෞතික පරිසරයට උචිත තම්මැට්ටමෙහි නවතම මිනුම්

ටී. එච්. එම්. දිනුක උදයන්ත තෙලසිංහ
උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය
සංගීත පීඨය

අතීතයේ පැවති අවනද්ධ භාණ්ඩ අතරින් තම්මැට්ටම හෙවත් පොකුරු බෙරයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ආදි කාලයේ සිට තම්මැට්ටම සංනිවේදන කාර්යය සඳහා මෙන් ම විවිධ ආගමික අවස්ථා සඳහා ද භාවිත කොට ඇත. එළිමහනේ වාදනය වන අවනද්ධ භාණ්ඩයක් වන තම්මැට්ටම තේවා කටයුතු, මළ බෙර වාදන, රණ බෙර වාදන ආදිය සඳහා යොදාගෙන ඇත. වර්තමානයේ දී ද තේවා කටයුතු හා මළ බෙර වාදන වැනි අවස්ථාවල දී තම්මැට්ටම වාදනය කෙරේ. තම්මැට්ටම වාදනය කිරීමේ දී එයින් නිකුත්වන ධ්වනිය සම්ප්‍රේෂණය වීම අතීතයේ දී මෙන් වර්තමානයේ දී සිදු වේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. පෙරට වඩා වර්තමානයේ දී වායු ප්‍රතිරෝධය වැඩි වීම නිසා ධ්වනි තරංග සම්ප්‍රේෂණය වීම කෙරෙහි එය බලපෑමෙන් අතීතයේ දී මෙන් තම්මැට්ටමේ ධ්වනිය ඈතට සම්ප්‍රේෂණය නො වේ යන්න උපන්‍යාසය යි. ධ්වනි තරංග සම්ප්‍රෂණය සඳහා බලපාන සාධක අධ්‍යයනය කිරීම හා වර්තමාන පරිසරයට උචිත වන ලෙස තම්මැට්ටමේ මිණුම් සංශෝධනය කළ හැකි ද යන්න අධ්‍යයනය කිරීම මෙම ප්‍රයේෂණයේ අරමුණු ය. මෙහි දී ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන මිශ්‍ර ක්‍රමවේදය භාවිත කරගැනිණි. ගුණාත්මක ක්‍රමවේදය යටතේ පොත්පත් පරිශීලනය, අන්තර්ජාල පරිශීලණය ආදිය මගින් ද, ප්‍රමාණාත්මක ක්‍රමවේදය යටතේ ලබාගත් දත්ත විද්‍යාත්මක සමීකරණ ඇසුරින් විශ්ලේෂණය කරමින් ද අවසාන නිගමනයකට එළඹිණි. ධ්වනි මූලාශ්‍රයේ සිට එය ශ්‍රවණය කරන්නා තෙක් ඇති දුර එහි ධ්වනි තීව්‍රතාවට ප්‍රතිලෝම ව සමානුපාතික වෙයි. එසේ ම ධ්වනි තීව්‍රතාව ධ්වනි මූලාශ්‍රයේ වර්ගඵලයට ප්‍රතිලෝම ව සමානුපාතික වෙයි. එබැවින් මූලාශ්‍රයේ වර්ගඵලය වැඩි කොට එහි ධ්වනි තීව්‍රතාව අඩු කිරීමෙන් වැඩි දුරක් ශබ්ද තරංග සම්ප්‍රේෂණය කළ හැකි ය. මේ අනුව එක් වියත් එකඟුලක(ආසන්න වශයෙන් අඟල් අටක්) විෂ්කම්භයෙන් යුක්ත වූ සාම්ප්‍රදායික තම්මැට්ටමේ හඬ බෑයෙහි විෂ්කම්භය අඟල් දහය දක්වා වැඩි කිරීමෙන් එහි ධ්වනිය වඩාත් ඈතට සම්ප්‍රේෂණය කළ හැකි ය. මේ අනුව වර්තමාන පාරිසරික තත්ත්වයන්ට ගැළපෙන ආකාරයට තම්මැට්ටමේ මිනුම් වෙනස් කිරීමෙන් එහි ධ්වනි සම්ප්‍රේෂණය අතීතයේ දී සිදු වූ පමණට ම සිදු කළ හැකි බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: තම්මැට්ටම, ධ්වනිය, සංඛ්‍යාතය, සංනිවේදනය, ධ්වනි තරංග*

# වෙළඳ දැන්වීම්කරණය තුළ අලෙවි උපක්‍රමයක් ලෙස සංගීත නිර්මාණය සහ භාවිතය

## (තෝරාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය බිස්කට් වෙළඳ දැන්වීම් හයක් ඇසුරින්)

ඒ. එම්. ආර්. මදූෂානි
සංගීත විද්‍යා අධ්‍යයනාංශය
සංගීත පීඨය

වෙළඳ ප්‍රචාරණය යනු මුදල් ගෙවනු ලබන හෝ අනුග්‍රාහකයින් මඟින් මෙහෙය වන පුද්ගලික නොවන සන්නිවේදන ක්‍රියාවලියකි. දැන්වීම්කාර්යය හුදෙක් නිර්මාණ කාර්යයකි. වෙළඳ දැන්වීම් නිර්මාණකරණයේ දී සේවාදායකයා ගේ හා දැන්වීම් ආයතනයේ ඉලක්කය වන්නේ භාණ්ඩ හා සේවා අලෙවි කිරීම හා ඉලක්ක කණ්ඩායම් ජය ගැනීම යි. වෙළඳ දැන්වීම්වලින් පාරිභෝගිකයා තුළ පෙළඹවීමක් ඇති කිරීමට සංගීතය භාවිත කළ හැකි ද යන්න පර්යේෂණයේ ගැටලුව යි. වෙළඳ දැන්වීම්කරණය සඳහා සංගීතයේ භාවිතය හා පාරිභෝගික ආකර්ෂණය ඉහළ නැංවීම සඳහා සංගීතයෙන් ඇති කළ හැකි බලපෑම හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණු වේ. මෙහි දී මන්චි හා මැලිබන් බිස්කට් ආයතන තුළ නිෂ්පාදනය වන බිස්කට් අතරින් එක් ආයතනයකින් නිෂ්පාදන 3 කට අදාළ ව නිෂ්පාදන 6ක් තෝරාගැනුණි. පර්යේෂණයේ නියැදිය ලෙස කුරුණෑගල ඉබ්බාගමුව ප්‍රදේශයේ ජීවත් වන පාරිභෝගිකයින් අතරින් අහඹු ලෙස 30 දෙනෙකු තෝරාගැනුණි. ලිඛිත මූලාශ්‍රය පරිශීලනයෙන් ද, නියැදිය පාදක කරගනිමින් ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීමෙන් ද තොරතුරු හා දත්ත එක් රැස් කෙරිණි. දත්ත විශ්ලේෂණයට අනුව ශ්‍රවණය සඳහා ලබාදුන් සංගීත ඛණ්ඩ අතරින් එක් සංගීත ඛණ්ඩයක් හෝ හඳුනාගැනීමට සියලු දෙනා සමත් වී ඇති බව දක්නට ලැබුණි. පුද්ගලයින් 18 දෙනෙකු සංගීත ඛණ්ඩ 3 කට වඩා හඳුනාගැනීමට සමත් වී ඇත. මේ අනුව වෙළඳ දැන්වීම් සඳහා සංගීතය යෝග්‍ය ලෙස භාවිත කිරීමෙන් ආයතනික ඉලක්ක කණ්ඩායම් ජය ගෙන ඇති බව හා සංගීත නිර්මාණයේ දී භාවිත සංගීත ශෛලිවලින් තේමාව ඉස්මතු කිරීම නිසා පාරිභෝගිකයා ගේ ස්මෘතික ඥනය ලබාගෙන ඇති බව මෙන් ම පාරිභෝගික ආකර්ෂණය ඇති කිරීමට සංගීතය උචිත ම මාධ්‍යයක් බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: වෙළඳ දැන්වීම්කරණය, පාරිභෝගික පෙළඹවීම, සංගීතය*

# වත්මන් දේශපාලන ප්‍රතිරූප ප්‍රවර්ධනයෙහි ලා දේශීය සංගීතයේ උපයෝගීතාව

ඩබ්. ටී. ඩබ්. ආර්. ජයනන්දි
සංගීත විද්‍යා අධ්‍යයනාංශය
සංගීත පීඨය

සංගීතය වනාහි පුද්ගල මනෝභාවයන් තීව්‍ර කිරීම සඳහා බලපෑම් කළ හැකි ප්‍රබල මාධ්‍යයකි. මිනිසා ගේ සමාජ, ආර්ථික, සංස්කෘතික හැසිරීම් කෙරෙහි සංගීතය බලපාන්නා සේ ම මිනිසා ගේ දේශපාලනික හැසිරීම් කෙරෙහිත් විශාල බලපෑමක් සංගීතයෙන් ඇති කෙරෙයි. අතීතයේ රජවරුන් පවා සිය දේශපාලන ප්‍රතිරූප ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රශස්ති ගායනා උපයුක්ත කොට ගෙන ඇත. යමෙකු ප්‍රතිපත්තිමය, ආකල්පමය හා දෘෂ්ටිමය වශයෙන් කුමන පරාමිතියක සිටිය ද ඔහු තුළ වූ මනෝභාව නවමු මානයක් කරා ගෙනයාමට සංගීතයට හැකි ය. වර්තමාන දේශපාලන ප්‍රතිරූප ප්‍රවර්ධනයෙහි ලා දේශීය සංගීතය මිනිස් මනෝභාවයන්ට බලපෑමක් ඇති කර තිබේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. දේශිය සංගීතය ශ්‍රී ලාංකේය දේශපාලන ප්‍රතිරූප තීව්‍ර කිරීමට මහත් බලපෑමක් ඇති කරන්නේ ය යන්න උපන්‍යාසය යි. ප්‍රායෝගික දේශපාලනයේ නියැලෙන්නන් සිය ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සඳහා යොදාගන්නා උපක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ යි. පර්යේෂණ සීමාව වශයෙන් 2005-2010 කාලය තුළ ශ්‍රී ලාංකේය දේශපාලනයේ නියුතු එක් චරිතයක් නියැදිය කොට ගැනුණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය පාදක කොට ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් ද, විද්‍යුත් මාධ්‍ය හා සමාජ ජාලා වෙබ් අඩවි පරිශීලනයෙන් ද ලබාගත් තොරතුරු විග්‍රහ කෙරිණි. තොරතුරු විග්‍රහයට අනුව වත්මන් දේශපාලන ප්‍රතිරූප ප්‍රවර්ධනයෙහි ලා දේශීය සංගීතය ප්‍රධාන කොට ගනිමින් දේශිය නාද රටා, තාල රටා හා දේශීය සංගීත භාණ්ඩ ආදිය මෙන් ම දේශීය බස් වහර ද ආභාසය කරගත් ගේය පද රචනා භාවිතයට නැඹුරු ව ඇත්තේ "**අපේකම**" යන්නා වූ තේමාව ප්‍රස්තුත කරගැනීමට බව පැහැදිලි ය. වත්මන් ශ්‍රී ලාංකේය දේශපාලනය සඳහා දේශිය සංගීතය උපක්‍රමශීලි ලෙස යොදාගනිමින්, පුද්ගල මනෝභාව තුළට **අපේකම** යන්න සියුම් ලෙස සංජානනය කරවීමට ගත් උත්සහයේ දී එය ගාමක බලයක් වී ඇති බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: දේශීය සංගීතය, දේශපාලන ප්‍රතිරූප, මනෝභාව, සංගීත උපයෝගීතාව, මාධ්‍ය*

# ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය කෙරෙහි ළමා කාව්‍ය ප්‍රබන්ධවල උපයෝගීතාව

ආර්. එම්. සමාධි එස්. රත්නායක
සංගීත විද්‍යා අධ්‍යයනාංශය
සංගීත පීඨය

ළමා කාව්‍ය ප්‍රබන්ධ යනු ළමයා ගේ මනසට ගැලපෙන අයුරින් ළමයින් ගේ ලෝකය තුළ පවතින විවිධ සංකල්ප, හැඩතල, රූප, වර්ණ ආදිය ඔවුන්ට ම උචිත බස් වහරකින් නිර්මාණය කෙරෙන කාව්‍ය විශේෂයක් ලෙසින් සරල ව ම හඳුනාගත හැකි ය. කුඩා කල සිට ම දරුවන් දැනුමෙන් මෙන් ම සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් සමඟ සමීප ව කටයුතු කිරීමට දෙමාපියෝ මෙන් ම ගුරුවරු ද අවස්ථාව ලබාදෙති. ප්‍රාථමික අධ්‍යාපනයේ දී බොහෝ විට ග්‍රන්ථ පරිශීලනයට වඩා ළමා කාව්‍ය ප්‍රබන්ධ ඇසුරුකොට ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදවීමට ගුරුවරු උත්සුක වෙති. පාසල් විෂය නිර්දේශය තුළ ද මේ සඳහා වැඩි ඉඩකඩක් ලබා දී තිබේ. ගණිතය, පරිසරය, සිංහල, ඉංග්‍රීසි යන විෂයයන් ඇසුරු කරගනිමින් එම විෂයට අදාල ව විෂය නිර්දේශයෙහි ඇති ළමා කාව්‍ය ප්‍රබන්ධ හතරක් පර්යේෂණ නියැදිය ලෙස යොදාගැනුණි. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඵලදායිතාව කෙරෙහි ළමා කාව්‍ය ප්‍රබන්ධවල උපයෝගීතාවක් තිබේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. ළමා කාව්‍ය ප්‍රබන්ධවල දී වැඩි වශයෙන් අවධානය දිනාගත හැකි කාව්‍ය ප්‍රබන්ධ, අවධානය ලබාගැනීමට ළමා කාව්‍ය ප්‍රබන්ධ යොදාගත යුතු අවස්ථා හා න්‍යායාත්මක ව උගැන්මට වඩා ළමා කාව්‍ය ප්‍රබන්ධ මඟින් ඉගැන්වීමේ දී ළමයා ගේ ග්‍රහණය කරගැනීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණු ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරුණු අතර ලිඛිත මූලාශ්‍රය පරිශීලනයෙන් ද, අන්තර්ජාලය පරිශීලනයෙන් ද, සහභාගීත්ව නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් ද තොරතුරු එක් රැස් කෙරිණි. ලබාගත් තොරතුරුවලට අනුව පන්තිකාමරය තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නිසි ආකාරයෙන් සිසුන් ගේ අවධානය රඳවාතබාගැනීමට ළමා කාව්‍ය ප්‍රබන්ධ උපකාරී වී ඇති බව නිරීක්ෂණය විය. ළමා කාව්‍ය ප්‍රබන්ධවල උපයෝගීතාව ප්‍රාථමික අධ්‍යාපනයේ දී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා මනා පිටිවහලක් වන බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: ළමා කාව්‍ය ප්‍රබන්ධ, ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය, ඵලදායිතාව උපයෝගීතාව*

# සිනමා සංගීතය හා රූප රචනය අතර පවත්නා සහසම්බන්ධතාව

එන්. ඒ. ඒ. කුලසූරිය
නර්තන රංගකලා ඉතිහාසය හා සිද්ධාන්ත අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

රූප මාධ්‍ය මූලික කොට ගත් කලා මාධ්‍යයක් ලෙස සිනමාව පෙන්වාදිය හැකි අතර එය දෙබස් හා සංගීත ඛණ්ඩවලින් පෝෂිත වූ කලා මාධ්‍යයක් මෙන් ම කර්මාන්තයක් ලෙස ද පෙන්වාදිය හැකි ය. දේශිය සිනමාව මුල් කාලීන ව ඉන්දියානු ආභාසයෙන් යුක්ත වූ අතර පසු කාලීන ව දේශිය ආභාසය සහිත ව ද ගොඩනැගෙන්න විය. සිනමා රූප රචනයේ සහ සංගීතයේ සුසංයෝජනය එහි තේමාව උද්දීපනය වීමට හේතු වන්නේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. සිනමා නිර්මාණ ප්‍රවර්ධනය කිරීම උදෙසා සංගීතය යොදාගැනීමත්, සිනමා කෘතියක පවතින ආකෘතියෙන් මිදී නව්‍ය ආකෘති ගොඩ නැගීම හා ඒ සඳහා සංගීතය යොදාගැනීමත්, රූප රචනා ශෛලියේ සිදු විය යුතු වෙනස්කම් අධ්‍යයනය කිරීමත් අරමුණු ය. මෙම අධ්‍යයනය සඳහා දේශිය සිනමා කෘති තුනක් වන නිධානය, හංස විලක් හා බඹරු ඇවිත් යන නිර්මාණ යොදාගැනුණි. ලිඛිත මූලාශ්‍රය පරිශීලනයෙන් ද, රූප රචනයේ යෙදෙන නිර්මාණකරුවන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් ද ලබාගත් තොරතුරු විග්‍රහ කිරීමෙන් අවසන් නිගමනයකට එළඹිනි. සිනමා රූප රචනය එහි සංගීත ඛණ්ඩ සමඟ සංසන්දනය කරන විට ඒවා අර්ථ රසයෙන් හා ශබ්ද රසයෙන් සහසම්බන්ධතාවක් දක්වන බව මෙම පර්යේෂණයෙන් නිරීක්ෂණය විය. සිනමා නිර්මාණයක ඵලදායිතාව වර්ධනය කිරීම උදෙසා සංගීතය හා රූප රචනය අතර පවත්නා සහසම්බන්ධතාව ඉතා වැදගත් සාධකයක් වන අතර නිර්මාණයේ අන්තර්ගත කතා වස්තුව තීව්‍ර කොට දනවීමටත්, අර්ථ රසය වැඩි කොට හුවා දැක්වීමටත් සංගීතය හා රූප රචනයේ සුසංයෝගය මහඟු පිටිවහලක් වන බව මෙමඟින් තහවුරු විය.

*ප්‍රමුඛ පද: අර්ථ රසය, භාව උද්දීපනය, රූප රචනය, සංගීතය, සිනමාව,*

# PSYCHOLOGY
# AND
# SOCIAL SCIENCE

පවුල් ආරවුල් හේතුවෙන් පාසල් දරුවන්ට ඇති වන බලපෑම 37

එච්. එල්. ඒ. දිනූෂා සෙව්වන්දි

කැලණි නදිය ආශ්‍රිත ව පවතින පුරාවෘත්තවල ඒෂණීයත්වය 38

ඩී. ජී. ඒ. පෙරේරා

කොවිඩ් වසංගත පාලනය හා බැඳි සාම්ප්‍රදායික දැනුමෙහි විද්‍යාත්මක පදනම 39

ටී. එම්. සකුණි නයනතාරා

The Impact of Covid-19 Pandemic on Music Education in Sri Lanka 40

Sandali Yapa Abeywardana

සංගීත අභිවහනයෙහිලා මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම
(ශ්‍රීලංකාවේ එළිමහන් සංගීත ප්‍රසංග ශිල්පීන් ඇසුරින්) 41

කේ. ජේ. මධුශාන්ති

හෙරොයින් භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනයෙන් පසු නැවත එයට
ඇබ්බැහිවීම සඳහා බලපාන සමාජීය බලපෑම 42

ඒ. පී. එස්. අබේරත්න

# පවුල් ආරවුල් හේතුවෙන් පාසල් දරුවන්ට ඇති වන බලපෑම

එච්. එල්. ඒ. දිනූෂා සෙව්වන්දි
නර්තන රංගකලා ඉතිහාස හා සිද්ධාන්ත අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

සමාජයේ කුඩා ම ඒකකය පවුල වන අතර එය සමාජ ක්‍රියාකාරිත්වයට බෙහෙවින් බලපායි. න්‍යෂ්ටික පවුල තුළ සැමියා සහ බිරිඳ අතර පැන නගින ගැටලු හේතුවෙන් පවුල් ආරවුල් නිර්මාණය වේ. එය දික්කසාදය දක්වා ම දුර දිග යාම සිදු වන අවස්ථා ද පවතී. පවුල් ආරවුල් හේතුවෙන් පාසල් දරුවන්ට බලපෑමක් ඇති කරයි ද යන්න පර්යේෂණ ගැටලුව යි. පවුල් ආරවුල්වලට ගොදුරු වූ න්‍යෂ්ටික පවුල් කිහිපයක පවුල් ආරවුල් ඇතිවීමට හේතු, දැන් පවතින පවුල් පරිසරය කෙබඳු ද, පවුල් ආරවුල් ඇති දෙමව්පියන් ගේ දරුවන් මුහුණදෙන ගැටලු සහ එම පීඩාකාරී ස්වභාවය පාසල් දරුවන්ට ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක යෙදීම පර්යේෂණ අරමුණු ය. තිස්සමහාරාම ප්‍රදේශයේ තිස්සමහාරාම සහ කිරින්ද පොලිස් වසම්වලට අදාල පවුල් ආරවුල් සහිත න්‍යෂ්ටික පවුල් කිහිපයක් මෙම පර්යේෂණය සඳහා තෝරාගැනුණි. ලිඛිත මූලාශ්‍රය පරිශීලනයෙන් ද, තෝරාගත් පවුල්වල සාමජිකයන් සමඟ මෙන් ම කිරින්ද පොලිසියේ පොලිස් නිලධාරියෙකු සමඟ සිදු කෙරුණු සම්මුඛ සාකච්ඡා සහ ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ද තොරතුරු එක් රැස් කෙරුණි. පවුල තුළ ස්වාමියා සහ බිරිඳ අතර පවතින ගැටලු දරුවන් සහ දෙමව්පියන් අතර ද ගැටලු ඇති වීමට හේතු වෙයි. මෙය පාසල් දරුවන්ට කායික, මානසික, ආධ්‍යාත්මික හා සමාජීය වශයෙන් බලපෑම් ඇති කෙරේ. මේ තත්ත්වය සමාජයෙන් යම් පමණකට හෝ තුරන් කිරීමට නම් දෙමව්පියන් දරුවන් පිළිබඳ වඩාත් සැලකිල්ලිමත් වී දරුවන් ගේ අනාගතයේ සාර්ථකත්වයට උර දෙන පවුල් ආරවුල් රහිත සමකාමී නිදහස් පවුල් පරිසරයක් ඇති කිරීම වැදගත් ය.

*ප්‍රමුඛ පද: ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, න්‍යෂ්ටික පවුල, පවුල්ආරවුල්, පාසල් අධ්‍යාපනය, ලිංගික හිංසනය*

# කැලණි නදිය ආශ්‍රිත ව පවතින පුරාවෘත්තවල ඒෂණීයත්වය

ඩී. ජී. ඒ. පෙරේරා
නර්තන රංග කලා ඉතිහාසය හා සිද්ධාන්ත අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

ලංකේය ඉතිහාසයේ රාජධානි වංශයන් අත්‍යන්තයේ ඉපැරණි රාජධානියක් වශයෙන් සුප්‍රසිද්ධ කැලණි පුරවරය බුදුන් ගේ තෙවෙනි ලංකාගමනයේ සනිටුහන සමඟ ලෝක පූජිත විය. කැලණි නදියේ පෞරාණික වටිනාකමට පූජනීයත්වයක් ආකලනය වූයේ ද උක්ත සංසිද්ධියෙන් අනතුරුව යි. සමනල කන්දෙන් අරම්භය සනිටුහන් කර කොළඹ මෝදර ප්‍රදේශයෙන් මුහුදට ගලා බසිනා කැලණි නදිය හා කේන්ද්‍රගත වූ පුරාවෘත්ත ද රැසකි. එකී පුරවෘත්තවල ඒෂණීයත්වයක් තිබේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව යි. ඇතැම් පුරාවෘත්ත සාක්ෂි සහිත ව විශ්වාස කළ හැකි මට්ටමක පවතින බවත් තවත් පුරාවෘත්ත විශ්වාස කිරීමට තරම් සාක්ෂි නොවීමෙන් ඒවා පුරවෘත්ත ලෙසට ම ඉතිහාසගත වන බවත් උපන්‍යාසය වූ අතර කැලණි නදිය හා සම්බන්ධ වැළලී යන පුරාවෘත්ත ජනගත කිරීම හා එමඟින් කැලණි නදිය සුරක්ෂිත කිරීමට අත්වැලක් සැපයීම මෙම පර්යේෂණයේ අරමුණ යි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරුණු අතර ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් ද, සම්මුඛ සාකච්ඡා, අන්තර්ජාලය හා සමාජ ජාලා වෙබ් අඩවි පරිශීලනයෙන් ද තොරතුරු එක් රැස් කෙරිණි. තොරතුරු විග්‍රහයෙන් ජනශ්‍රැතියේ පවතින මතවාදවල නිරවද්‍යතාව අනාවරණය කරගත් අතර එකී තොරතුරු හරහා ද ඇතැම් පුරාවෘත්ත සාක්ෂි සහිත ව විශ්වාස කළ හැකි මට්ටමක පවතින බවටත්, තවත් පුරාවෘත්ත පුරවෘත්තයන් ලෙසට ම ඉතිහාසගත වන බවටත් තහවුරු කරගැනීමට හැකි විය. මෙකී පුරාවෘත්ත අනුසාරයෙන් කැලණි නදිය හා බැඳි පූජනීයත්වය සමාජය තුළ ඉස්මතු කිරීමට පදනම් සාධකයක් සපයා ඒ ඔස්සේ දූෂිත ව ඇති කැලණි නදිය පූජනීය ව සංරක්ෂණය කිරීම සඳහා අනුබලයක් ලබා දිය හැකි වන අතර වැළලී යන ඉතිහාසයේ මෙවන් වටිනා වෘතාන්ත ජනගත කිරීමට ඉදිරියේ දී කටයුතු සම්පාදනය කිරීම ලෝකයට ම වඩාත් ඵලදායී වනු ඇති බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: කැලණි නදිය, ජනශ්‍රැති, පුරාවෘත්ත, පූජනීයත්වය, විශ්වාසනීයත්වය*

# කොවිඩ් වසංගත පාලනය හා බැඳි සාම්ප්‍රදායික දැනුමෙහි විද්‍යාත්මක පදනම

ටී. එම්. සකුණි නයනතාරා
නර්තන රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

සමාජයේ බෝ වන රෝග අවම කරගැනීමට පැරණි ශ්‍රී ලාංකේය ජන සිරිත් යොදාගෙන ඇත. කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළ ප්‍රදේශයේ අද්‍යතන කොවිඩ් වසංගත පාලනය සඳහා එම රෝග නිවාරණ ක්‍රම යොදාගෙන ඇති ආකාරය පිළිබඳ විමර්ශානාත්මක අධ්‍යයනයක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරෙයි. කොවිඩ් වසංගත පාලනය සඳහා සාම්ප්‍රදායික දැනුම විද්‍යාත්මක පදනමකින් යොදාගෙන තිබේ ද යන්න පර්යේෂණයේ ගැටලුව යි. මෙම රෝග නිවාරණ ක්‍රමවල ඇති දේශීය ඥානයෙහි විද්‍යාත්මක පදනම පිළිබඳ ව සහ එම විධික්‍රම රෝග පාලනය සඳහා ලබාදී ඇති දායකත්වය අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණු වේ. ගුණාත්මක හා ප්‍රමාණාත්මක මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයට අනුගත ව තොරතුරු හා දත්ත රැස් කෙරිණි. එහි දී සල්පිටි කෝරළයේ පිළියන්දල, කැස්බෑව හා පොල්ගස්ඕවිට යන ප්‍රදේශයන්හි වෛද්‍යවරුන්, මහජන සෞඛ්‍ය නිළධාරීන්, ගුරුවරුන් සහ ගම්වැසියන් දහසය දෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් සහ විධිමත් ප්‍රශ්නාවලියක් මුල් කරගනිමින් දත්ත රැස් කෙරිණි. පැරණි ජනයා බෝ වන රෝග නිවාරණයට යොදාගත් සාම්ප්‍රදායික දැනුමෙන් පැවත එන ක්‍රම අතරින් ඔවුන් රෝගය සමාජගත නොවීමට සිදු කළ දේ, විෂබීජ විනාශ කිරීමට ගත ක්‍රියා මාර්ග හා පුද්ගල ප්‍රතිශක්තිය වැඩි කිරීමට ගත් පියවරයන්හි විද්‍යාත්මක පදනම නිරීක්ෂණයට ලක් කෙරිණි. පෙරුම්කායන් බැඳීම සිදු වී ඇත්තේ එහි ඇති ප්‍රතිවෛරස ගුණය, එනම් වෛරස මැරවීමේ හැකියාවක් ඇති නිසා ය. කොහොඹ කොළ, අඹ කොළ වැනි ශාක යොදාගෙන ඇත්තේ එහි විෂබීජ නැසීමට ඇති හැකියාවත්, ඉන් ඔක්සිහරණය පහසු කිරීම වැනි විද්‍යාත්මක හේතු නිසා යි. ඊට අමතර ව වේදු ඇල්ලීම, පාදිය බඳුන් තැබීම, පත්තිනි පැටවින් ගේ රෙදි අව්වට දැමීම, වසංගත වැටි දැමීම හා ප්‍රතිශක්ති වඩවන ආහාර දීම, යනාදි දේශීය ඥානය භාවිතයෙන් පැවත ආ දේවල් අද්‍යනයේ විද්‍යාත්මක පදනමක් මත භාවිත කරන බවට නිරීක්ෂණය විය. තව ද ප්‍රතිශක්තිය වඩවන පාන, කසාය වර්ග කොවිඩ් වසංගත තත්ත්වය පාලනයට යොදාගෙන ඇත. මෙවැනි ප්‍රත්‍ය ඖෂධ මාලාවන් භාවිතයට ගෙන බෝ වන රෝග අවම කරගැනීමට අද්‍යතන සමාජය යොමු වී ඇති බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: කොවිඩ් වසංගතය, බෝවන රෝග, රෝග නිවාරණ ක්‍රම, වේදු ඇල්ලීම, සාම්ප්‍රදායික දැනුම*

# The Impact of Covid-19 Pandemic on Music Education in Sri Lanka

Sandali Yapa Abeywardana
Department of Musicology
Faculty of Music

The World Health Organization declared the Covid-19 epidemic a pandemic, and it has spread rapidly around the world sending billions of people into lockdown and isolate themselves during the covid-19 outbreak. The covid-19 pandemic has forced schools and higher educational institutions to a halt, rendering academic calendars futile and open distance learning education solutions have become the mandatory choice to maintain educational processes in this period in Sri Lanka. Music education is slightly different compared with the other fields of education because music is a practical subject and cannot be studied by online learning platforms alone. This research aimed to gain an understanding of the impact of the Covid-19 pandemic on music education in Sri Lanka. The data of this research was gathered by using interviews and for this research randomly selected 20 people were used. The research has found both negative and positive effects and identified a considerable number of problems. The main issues identified in this research were shifting from face-to-face music practical learning methods to online practical classes, and some music techniques are difficult to understand on their own. Quality equipment and a good environment are needed to study music at home, and that is another critical issue that needs proper attention. This study recommended that educational instructors should be more concerned about the student's health, safety and obviously the mental health well-being of students should be the top propriety.

*Keywords: Covid-19 pandemic, Education in Sri Lanka, Impact of Covid-19, Music Education, Sri Lanka*

# සංගීත අභිවහනයෙහිලා මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම
## (ශ්‍රීලංකාවේ එළිමහන් සංගීත ප්‍රසංග ශිල්පීන් ඇසුරින්)

කේ. ජේ. මධුශාන්ති
මානවවංශ සංගීත විද්‍යා අධ්‍යයනාංශය
සංගීත පීඨය

ආහාර හෝ ජලය හැරුණු විට වෙනත් කුමන හෝ ද්‍රව්‍යයක් ශරීරයට ගත් විට පුද්ගල මනෝභාවය, චින්තනය හා ස්නායු ක්‍රියාකාරීත්වය වෙනස් වෙයි නම් එය මත්ද්‍රව්‍යයක් ලෙස හැඳින්විය හැකි ය. සාමාන්‍ය මිනිස් අවශ්‍යතාවක් වන විනෝදාස්වාද ක්‍රියාකාරකම්වල දී විවිධ වූ ශාරීරික උත්තේජක ද්‍රව්‍ය ලබාගැනීම සමාජයේ බහුල ව දක්නට ඇත. සංගීත අභිවහනය සඳහා මත්ද්‍රව්‍යය භාවිතයෙන් ඍජු බලපෑමක් වේ ද යන්න පර්යේෂණ ගැටලුව ය. මත්ද්‍රව්‍ය පිළිබඳ ව සංගීත ශිල්පින් දක්වන විවිධ මත පුද්ගල මනෝභාවය හා ඔවුන් මත්ද්‍රව්‍ය පිළිබඳ ව දරණ ආකල්ප මඟින් සිදු වන යහපත් හා අයහපත් බලපෑම් විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම අරමුණ ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමණය කෙරුණු අතර ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනයෙන් ද, අන්තර්ජාල වෙබ් අඩවි පරිශීලනයෙන් ද, තෝරාගත් සංගීත කණ්ඩායම්වල සාමාජිකයින් වෙත ඉදිරිපත් කළ ප්‍රශ්නාවලි මෙන් ම සම්මුඛ සාකච්ඡා මඟින් ද තොරතුරු එක් රැස් කෙරුණි. ප්‍රශ්නාවලි ඇසුරෙන් ලබාගත් දත්ත විශ්ලේෂණයේ දී බහුතර පුද්ගලයින් අතර ඇත්තේ මත් ද්‍රව්‍ය පිළිබඳ ඇබ්බැහිවීමක් බව දක්නට ලැබුණි. වර්තමාන තරුණ සංගීත පරපුර සමාජයේ කැපී පෙනීමටත්, විනෝදකාමී වටපිටාවක් ගොඩනගාගැනීමටත් මත් ද්‍රව්‍ය භාවිත කරන බව මෙම පර්යේෂණයෙන් සනාථ විය.

*ප්‍රමුඛ පද:* අභිවහනය, මත්ද්‍රව්‍ය, මත් ලෝලී බව, ඇබ්බැහි වීම, එළිමහන් සංගීත ප්‍රසංග

# හෙරොයින් භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනයෙන් පසු නැවත එයට ඇබ්බැහිවීම සඳහා බලපාන සමාජීය බලපෑම

ඒ. පී. එස්. අබේරත්න

නර්තන රංගකලා ඉතිහාස හා සිද්ධාන්ත අධ්‍යයනාංශය

නර්තන හා නාට්‍ය කලා පීඨය

ගෝලීය සන්දර්භය තුළ හෙරොයින්වලට ඇබ්බැහි වීම ප්‍රධාන සමාජ ගැටලුවකි. පුනරුත්ථාපන ක්‍රියාවලියෙන් පසු හෙරොයින්වලට ඇබ්බැහි වූවෝ නැවත සමාජයට මුදා හැරෙති. නමුත් සැලකිය යුතු සාධකය නම් ඔවුන් නැවත නැවතත් හෙරොයින්වලට ඇබ්බැහි වී පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට ඇතුළු කිරීමට සිදු වීම යි. හෙරොයින් භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනයෙන් පසු නැවතත් හෙරොයින් භාවිතයට ඇබ්බැහි වීමට සමාජයෙන් බලපෑමක් සිදු වේ ද යන්න පර්යේෂණයේ ගැටලුව වේ. පුනරුත්ථාපන මධ්‍යස්ථාන මඟින් පුනරුත්ථාපන ක්‍රියාවලි කෙතරම් සාර්ථක ව සිදු කළ ද ඒ සඳහා සමාජයෙන් දායකත්වය නො ලැබේ ය යන්න උපන්‍යාසය යි. හෙරොයින් මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වී පුනරුත්ථාපනය වීමෙන් පසු ව නැවතත් ඔවුන් හෙරොයින්වලට ඇබ්බැහි වීම සඳහා බලපාන සමාජීය සාධක නිරීක්ෂණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ යි. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරුණු අතර ලිඛිත මූලාශ්‍රය අධ්‍යයනයෙන් ද, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන් හා නිට්ටඹුව නවදිගන්තය නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ හෙරොයින් පමණක් භාවිත කර පුනරුත්ථාපනය වන නේවාසිකයින් දොළොස්දෙනෙකු සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් ද දත්ත එක්රැස් කෙරිණි. දත්ත විශ්ලේෂණයෙන් හෙරොයින්වලට ඇබ්බැහි වූවන් උදෙසා සිදු කෙරෙන පුනරුත්ථාපන ක්‍රියාවලියෙන් අනතුරු ව පසුවිපරම් ක්‍රියාවලිය සිදු නොවීම හා පුනරුත්ථාපන ක්‍රියාවලිය සාර්ථක කරගැනීම උදෙසා සමාජයෙන් ලැබිය යුතු දායකත්වය නොලැබීම හේතුවෙන් නැවතත් ඔවුන් හෙරොයින් භාවිතයට ඇබ්බැහිවීම සිදු වන බව නිරීක්ෂණය විය. සමාජ කණ්ඩායම්වල මැදිහත් වීම පුනරුත්ථාපන ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා අත්‍යවශ්‍ය වෙයි. පුනරුත්ථාපන ක්‍රියාවලියේ දී පවුල් උපදේශනය ලබාදීම, ආයතනික මට්ටමින් විධිමත් වූ පසුවිපරම් ක්‍රියාවලියක් හඳුන්වාදීම හා සක්‍රීය ව එය ක්‍රියාත්මක කිරීම, පසු විපරම් ක්‍රියාවලිය උදෙසා සම්බන්ධිත සියලු ම ප්‍රජා කණ්ඩායම් සහභාගී කරවාගැනීම, පුනරුත්ථාපන ආයතන වෙතින් ලබාදෙන වෘත්තීය පුහුණුවෙන් අනතුරු ව පුනරුත්ථාපනය වූවන් සුදුසු රැකියා සඳහා යොමු කිරීම පුනරුත්ථාපනයෙන් පසු නැවත හෙරොයින්වලට ඇබ්බැහිවන්නන් ගේ සංඛ්‍යාව අවම කරගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග ය.

*ප්‍රමුඛ පද:* ඇබ්බැහි වීම, පුනරුත්ථාපනය, සමාජගත කිරීම, හෙරොයින්, සමාජීය බලපෑම.

# DANCE

සාකල්‍ය නර්තන ශිල්පියෙකු බිහි කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක් 45

වී. ඒ. එන්. හේවාවසම්

පහතරට විහාර සිතුවම්හි නිරූපිත නර්තන හා වාද්‍ය භාණ්ඩ
(මුල්ගිරිගල හා කරගම්පිටිය ඇසුරෙන්) 46

ඩී. එම්. ඉරේෂා ධනංජනී

වන්නම්හි ලය සහ නාදමාලා මඟින් ප්‍රකට වන සත්ත්ව නිරූපණ 47

වී. කේ. ඒ. චමෝද්‍යා රශ්මිප්‍රභා කුරුප්පු

ශ්‍රී ලාංකේය නර්තන කලාව හා ජන මනෝවිද්‍යාව 48

එම්. ලසනි සඳුනිකා

රිද්දියාගයේ සහ කඩවර කංකාරියේ අන්තර්ගත කාන්තා උපදේශනය 49

එස්. ඒ. ජී. කවින්ද්‍යා

# සාකල්‍ය නර්තන ශිල්පියෙකු බිහි කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක්

වී. ඒ. එන්. හේවාවසම්

පහතරට නර්තන අධ්‍යයනාංශය

නර්තන හා නාට්‍ය කලා පීඨය

නර්තනය යනු රිද්මයානුකූල හා භාවාත්මක චලනවල එකතුවකි. නර්තන ශිල්පියෙකු ශාරීරික හා මානසික සමබරතාවෙන් යුක්ත විය යුතු ය. උක්ත කී සාධක සහ ආධ්‍යාපනික හා මූල්‍යමය සංවර්ධනය, සාකල්‍ය නර්තන ශිල්පියකු බිහිවීමෙහි ලා උපයුක්ත වනවා ද යන්න පර්යේෂණයේ ගැටලුව යි. ශාරීරික, මානසික, ආධ්‍යාත්මික, මූල්‍යමය සහ ආධ්‍යාපනික සංවර්ධනය සාක්ෂාත් කරගන්නා නර්තන ශිල්පියාට සාකල්‍ය නර්තන ශිල්පියෙකු බවට පත්විය හැකි බව පර්යේෂණයේ උපන්‍යාසය යි. සාකල්‍ය නර්තන ශිල්පියෙකු බිහි කිරීමෙහි ලා උපයුක්ත වන කරුණු අධ්‍යයනය කිරීම පර්යේෂණ අරමුණ යි. ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් ද, විෂය ප්‍රවීණයන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් ද තොරතුර එක් රැස් කෙරිණි. එසේ ම සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨයේ පහතරට නර්තන අධ්‍යයනාංශයේ හතළිස් තුන් දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් නියැදියක් ලෙස ගෙන මෙම පර්යේෂණය වසර දෙකක් මුළුල්ලේ සිදු කර දත්ත ඒක රාශී කොට ගැනුණි. ඔවුන් ගේ ශාරීරික, මානසික, ආධ්‍යාත්මික, මූල්‍යමය සහ ආධ්‍යාපනික පැතිකඩ දියුණු කිරීමට ව්‍යායාම, භාවනා, පෙළඹවීමේ වැඩසටහන්, මුල්‍යමය වැඩසටහන් සහ ඉගෙනුම් ක්‍රම පිළිබඳ ව දැනුවත් කිරීමේ වැඩසටහන් ආදි ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල එක සමාන කාල පරාසයක් තුළ සිදු කෙරුණු අතර යොදාගත් වර්ෂ දෙක අවසානයේ දී ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් මොවුන් ගේ සාකල්‍ය මට්ටම මැන ගැනුණි. දත්ත විශ්ලේෂණයට අනුව පෙනී ගියේ, උක්ත කී එක් සාධකයක් පමණක් නො ව, සියලු සාධක පූර්ණය කරගැනීම සඳහා යොමු කරන ලද ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නොකඩවා සාර්ථක ව සතතාභ්‍යාසයේ යෙදෙන නර්තන ශිල්පියෙකුට සාකල්‍ය නර්තන ශිල්පියෙකු විය හැකි බව යි.

*ප්‍රමුඛ පද: සාකල්‍ය, ශාරීරික, මානසික, ආධ්‍යාත්මික, මූල්‍යමය, ආධ්‍යාපනික*

# පහතරට විහාර සිතුවම්හි නිරූපිත නර්තන හා වාද්‍ය භාණ්ඩ
## (මුල්ගිරිගල හා කරගම්පිටිය ඇසුරෙන්)

ඩී. එම්. ඉරේෂා ධනංජනී
නර්තන රංගකලා ඉතිහාස හා සිද්ධාන්ත අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

ලක්දිව සිතුවම් කලාව අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා පෝෂණය වෙමින් පැවති ඇත. බුදුදහමේ ආභාසය කැටි වූ සිතුවම් කලාවක් විහාරස්ථාන මූලික කරගනිමින් බිහි ව ඇත. මහනුවර යුගයේ පහතරට විහාර සිතුවම් නිරූපණය කිරීමේ දී පහතරට නර්තන සම්ප්‍රදායට පමණක් අයත් නර්තන ඉරියව්, වාද්‍ය භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණ යොදාගෙන තිබේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. සිතුවම් කලාව පිළිබඳ අධ්‍යයනය කිරීම පර්යේෂණ අරමුණ යි. මුල්ගිරිගල හා කරගම්පිටිය විහාරස්ථාන මූලික කරගනිමින් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනයෙන් ද, ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ද ස්වාමීන්වහන්සේලා, ආචාර්යවරුන්, චිත්‍රකලා සම්බන්ධ ආචාර්යවරුන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් ද ලබාගත් තොරතුරු ඇසුරෙන් අවසන් නිගමනයට එළඹිණි. මෙම සිතුවම්හි ජාතක කතා හා පෙරහැර ආශ්‍රිත සිතුවම් නිරූපණය කිරීමේ දී ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්ත්වයට ම අයත් වාද්‍ය භාණ්ඩ සිතුවම් කිරීම දැකගත හැකි ය. පහතරට නර්තන සම්ප්‍රදායේ මූලික ඉරියව් හා සමාන ඉරියව් ද, ඒ හා සමාන රංග වස්ත්‍රාභරණ ද දක්නට ඇත. වෙස්මුහුණු සිතුවම් කිරීම මඟින් පහතරට සාම්ප්‍රදායික බලි සිත්තරු ආභාසය ලැබී ඇති බවත්, විදේශීය වාද්‍ය භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණ සිතුවම් නිරූපණයට යොදාගැනීම පහතරට ප්‍රදේශයේ සිදු වූ විදේශීය ආක්‍රමණවල බලපෑම නිසා සිදු ව ඇති බවත් කිව හැකි ය. එමෙන් ම මෙහි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ඒ කාලය තුළ පැවති පරිසර වටපිටාවන් සිතුවම් මඟින් නිරූපණය කිරීම යි. එනම් පෙරහැර ආශ්‍රිත සිතුවම් නිරූපණය කිරීමේ දී යොදාගත් රංග වස්ත්‍රාභරණ හා වාද්‍ය භාණ්ඩවලින් විදේශීය ආභාසය පැහැදිලි ව හඳුනාගත හැකි ය.

*ප්‍රමුඛ පද: පහතරට සම්ප්‍රදාය, බලි සිත්තරු, රංග-වස්ත්‍රාභරණ, විදේශීය ආභාසය, විහාර සම්ප්‍රදාය*

# වන්නම්හි ලය සහ නාදමාලා මඟින් ප්‍රකට වන සත්ත්ව නිරූපණ

වී. කේ. ඒ. චමෝද්‍යා රශ්මිප්‍රභා කුරුප්පු
උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය
සංගීත පීඨය

සිංහල වන්නම් සම්ප්‍රදාය උඩරට, පහතරට, සබරගමු හා රජරට ලෙස බෙදී පවතී. සිංහල වන්නම් දෙවිදේවතාවරුන් ගේ ගුණ සහ සතුන් ගේ ඉරියව් වර්ණනා කිරීමට රචනා කරන ලද ගීත විශේෂයක් වශයෙන් පිළිගනු ලැබේ. වන්නම් යනු ධ්වනි ඡන්දස් ක්‍රමයකි. වන්නම් ගායනය සඳහා වෙන් වූවක් වුවත් පසුකාලීන ව ඒ සඳහා නෘත්‍යය ද සම්බන්ධ කෙරිණි. වන්නම්හි ලය සහ නාදමාලා මඟින් සත්ත්ව නිරූපණ සාර්ථක ව සිදු වේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව ය. සත්ත්ව චර්යාවන්ට අනුකූල ව ලය හා ස්වරය සුසංයෝගයෙන් සාර්ථක ව සත්ත්ව නිරූපණය සිදු කළ හැකි ය යන්න උපන්‍යාසය යි. සත්ත්ව චර්යාවන් ප්‍රකටවන පරිදි වන්නම්හි ලය සහ තාල රටාවන්හි භාවිතය අධ්‍යයනය කිරීම සහ සත්ත්ව නිරූපණ පිළිබිඹු කිරීමට වන්නම්හි යොදාගෙන ඇති නාදමාලා අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණු ය. පර්යේෂණ නියදිය ලෙස උඩරට වන්නම් අතරින් ගජගා, හනුමා, මුසලඩි, උකුසා යන වන්නම් හතර මෙම අධ්‍යයනය සඳහා යොදාගැනුණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරුණු අතර සාහිත්‍යාගත මූලාශ්‍රය අධ්‍යයනයෙන් සහ නර්තන ශිල්පීන්, සංගීත ආචාර්යවරුන්, නර්තන ආචාර්යවරුන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා ඇසුරින් තොරතුර එක් රැස් කෙරිණි. තොරතුරු විග්‍රහයෙන් රිද්මයානුකූල අක්ෂර සංයෝජනයෙන් වන්නම් නිර්මාණය කර ඇති බව තහවුරු විය. වන්නම්හි ස්වරයට වඩා අවධානය ලැබී ඇත්තේ තාල රටාවට ය. වන්නමේ තාල රූපය ගෙනහැරපාන තානම ගායනා කෙරෙන්නේ සත්ත්ව චර්යා රටාවන්හි විවිධත්ව ඉස්මතු වන පරිදි විවිධ තිත් ප්‍රභේද භාවිත කරමින් ය. මෙම උඩරට වන්නම් ගායනා කිරීමේ දී ඒ ඒ සත්ත්වයා ගේ චර්යා හා ගමන් විලාසයන්හි පවතින රිද්මයානුකූල භාවය අනුව ඊට උචිත ලෙස ලයේ ස්වාභාවය වෙනස් කර ඇති අතර වන්නම්හි නාදමාලා වෘත්ත ලක්ෂණ සහිත ව එක් එක් සත්ත්වයා ගේ චර්යාවන්හි පවතින රිද්මයානුකූල ලක්ෂණ නිරූපණය වන පරිදි නිර්මාණය කොට ඇත. ඒ අනුව සත්ත්ව චර්යාවන් සඳහා ගත වන කාලය හා ඔවුන් ගේ අවකාශ භාවිතය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලය සහ නාදමාලා භාවිත කරමින් වන්නම් නිර්මාණය කර ඇති බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: සත්ත්ව චර්යා රටා, ඡන්දස්, වන්නම්, වෘත්තය, ලය*

# ශ්‍රී ලාංකේය නර්තන කලාව හා ජන මනෝවිද්‍යාව

එම්. ලසනි සඳුනිකා
පහතරට නර්තන අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

සෑම සමාජ සංධාරයක ම ජීවත් වන මිනිසුන් ගේ වෘතාන්ත සහ සම්ප්‍රදායන් ද, ඇදහිලි ක්‍රම හා මිත්‍යා විශ්වාස ද පාරම්පරික ඥානය යි. ගෘහාශ්‍රිත කටයුතු, සමාජ චර්යා, සිතුම් පැතුම්, මිනිසා එදිනෙදා භාවිතයට ගන්නා ද්‍රව්‍ය සූචකයන් හා සියල්ල ජන මනෝවිද්‍යාව නියෝජනය කරන සමාජ සංවිධානයේ පාරම්පරික දෘෂ්ඨීයට ඇතුළත් ය. ජන මනස පිළිබඳ අධ්‍යයනය ලාංකීය නර්තන කලාව හා ශාන්තිකර්ම තුළ විශේෂයෙන් දක්නට ලැබෙන අතර එය අත්‍යවශ්‍ය වූවකි. වර්තමානයේ නර්තන කලාව හා ජනශ්‍රැතිය විෂය ඔස්සේ ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි පවතින නර්තන කලාව හා ජනශ්‍රැතිය, මනෝවිද්‍යාව සමඟ ප්‍රාමාණික සම්බන්ධතාවක් ඇති කරන්නේ ද යන්න පර්යේෂණ ගැටලුව යි. ශ්‍රී ලාංකේය නර්තන කලාවට උක්ත විෂයයන් ආවරණය වන පරිදි නව ප්‍රාස්තවික ප්‍රාමාණික විෂයයක් අත්‍යවශ්‍යය යන්න උපන්‍යාසය යි. නර්තනය හා කලා පද්ධතියට ජන මනෝවිද්‍යාත්මක පැතිකඩ හඳුන්වාදීම මෙම පර්යේෂණයේ අරමුණ යි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරුණු අතර ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් හා ක්ෂේත්‍රයේ ප්‍රවීණ විද්වතුන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා උපයෝගී කරගනිමින් තොරතුරු එක් රැස් කෙරිණි. ජන මනෝවිද්‍යාව හා එහි අන්තර්ගත න්‍යායන් නර්තන කලා පද්ධතියට එක් කිරීමෙන් වර්තමානයේ ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි පවතින නර්තන කලාව, ජනශ්‍රැතිය හා මනෝවිද්‍යාව අතර සම්බන්ධතාව සාර්ථක ව එක් විෂය පථයකට ගැනීමට සුදුසු බව යෝජනා කළ හැකි ය.

*ප්‍රමුඛ පද: ජන මනෝවිද්‍යාව, ශ්‍රී ලාංකේය නර්තන කලාව, ජනශ්‍රැතිය, මනෝවිද්‍යාව, ජන මනස*

# රිද්දියාගයේ සහ කඩවර කංකාරියේ අන්තර්ගත කාන්තා උපදේශනය

එස්. ඒ. ජී. කවින්ද්‍යා
නර්තන රංගකලා ඉතිහාසය සහ සිද්ධාන්ත අධ්‍යයනාංශය
නර්තන හා නාට්‍ය කලා පීඨය

කාන්තාව පතිනියක සහ මවක වශයෙන කටයුතු කිරීමේ දී ඇයට විවිධ සංකූලතාවන්ට හා ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වෙයි. අතීත ගැමි කාන්තාවකට එකී ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳ ව විවෘත ව ප්‍රශ්න කිරීමට හෝ සාකච්ඡා කිරීමට ඇති ඉඩප්‍රස්ථාව බෙහෙවින් ම අල්ප වූ අතර කාන්තාවක වශයෙන් ඇය කායික මෙන් ම මානසික පසුබෑමකට ගොදුරු වීමේ ප්‍රවණතාව ද ඉහළ විය. එහෙයින් ගැමි සමාජයේ කාන්තාව උදෙසා උපදේශනාත්මක ක්‍රියාවලියක අවශ්‍යතාව ප්‍රබල ව ඉස්මතු වෙයි. තත් කාලීන සමාජ සංදර්භයෙහි එකී උපදේශන විධික්‍රමය වූයේ ශාන්තිකර්මය යි. පතිනියක හෝ මවක වූ කාන්තාවක් විෂයයෙහි පවත්නා එකී ගැටලුකාරී තත්ත්වයන් සමනය කරගැනීම උදෙසා කඩවර කංකාරිය සහ රිද්දියාගය මඟින් උපදේශනයක් සිදු වේ ද යන්න පර්යේෂණ ගැටලුව වන අතර උක්ත ශාන්තිකර්මද්වය මඟින් කාන්තාවකට ශාරීරික හා මානසික ස්වස්ථතාව ඇති කර ගැනීම උදෙසා උපදේශනාත්මක කාර්යයක් සිදු වේ ය යන්න උපන්‍යාසය යි. කඩවර කංකාරිය සහ රිද්දියාගයෙහි අන්තර්ගත චාරිත්‍ර-වාරිත්‍ර සහ නාට්‍යමය පෙළපාළිවල සමවිෂමතා පිළිබඳ ව මෙන් ම කාන්තා උපදේශනයෙහි ලා උක්ත ශාන්තිකර්මද්වය මඟින් ඉටු වන මෙහෙය පිළිබඳ සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ යි. ශාන්තිකර්ම පුළුල් විෂය පරාසයක් බැවින් උඩරට සහ පහතරට ප්‍රදේශයන්හි පවත්නා ගර්භශාන්ති විධි වූ කඩවර කංකාරිය සහ රිද්දියාගය පර්යේෂණ ප්‍රස්තුතයේ අධ්‍යයන ක්ෂේත්‍රය යි. ගුණාතමක පර්යේෂණ ක්‍රමවේදයට අනුගත ව ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය සහ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය මඟින් තොරතුරු එක්රැස් කෙරිණි. කඩවර කංකාරියේ දී සාර්ථක සහකරුවෙකු සතු පෞරුෂ ලක්ෂණ ද, රිද්දියාගයේ දී සිය කුටුම්භයෙහි අන්‍යෝන්‍ය අවබෝධය හා සහයෝගීතාව ඇතිකරලීම ද, නානුමුරය වැනි පෙළපාළි අංග මඟින් කාන්තාව සතු සහජ උපක්‍රමශීලී ඥානය අවධි කිරීම ද සිදු වෙයි. මෙම ශාන්තිකර්ම මඟින් කාන්තාවකට ගෘහාශ්‍රිත කාර්ය මෙන් ම කුටුම්භයෙහි උද්ගත වන ගැටලුකාරී තත්ත්ව සමනය කරගනු වස් ඍජු ව මෙන් ම වක්‍රානුකූල ව ද උපදේශනයක් සැපයෙන අතර සාර්ථක ලිංගික කාර්යයක් උදෙසා ද උපදේශනාත්මක සංනිවේදන කාර්යයක් ඉටු කරනු බැව් නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද: රිද්දියාගය, කඩවර කංකාරිය, නාට්‍යමය පෙළපාළි, සාම්ප්‍රදායික දැනුම, කාන්තාව*

## Organizing Committee

**Symposium Chair**

Prof. Kolitha Bhanu Dissanayake, Dean- Faculty of Graduate Studies

**Committee of the Symposium**

Prof. Kolitha Bhanu Dissanayake, Dean- Faculty of Graduate Studies

Snr. Lec. D. Chanaka Peiris, Head- C.de S. Kulathilake Archival & Research Unit

Snr. Lec. Mahinda Senevirathne, HOD- Department of Applied Arts & Mass Communication

Snr. Lec. Kamani Samarasinghe, Faculty of Music

**Convener**

Snr. Lec. D. Chanaka Peiris, Head- C. de S. Kulathilake Archival & Research Unit

**Symposium Secretary**

Mrs. Niluka Thilakarathne, Scientific Assistant- C. de S. Kulathilake Archival & Research Unit

**Coodinators**

Mr. Ravindra Alagiyawanna
Mr. Mahendra Hemantha Fernando
Mr. Asith Chanishka Athapaththu
Mr. Samitha samarathunge
Mr. Pawara Nawamina

**Coordinating Assistants**

Mr. Sampath Kularathna
Mr. Dharshana Samarawickrama
Mr. Pubudhu Harshana
Ms. Sachini Kaushalya
Mr. Ishan Maduwan

# DEVELOPING RESEARCH CULTURE ON THE ARTS IN A CHANGING WORLD